

# නැඹ

CED ත්‍රෛමාසික පුවත් සඟරාව

CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සංවිධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව තුන්වන කලාපය 2017 සැප්තැම්බර්

# තිරසර සංවර්ධනය හා අධ්‍යාපනය



සංවර්ධනය නොකඩවාම සිදුවේ නම් එය තිරසර සංවර්ධනය යැයි පැවසිය හැකිය. වෙනත් වචනවලින් පවසන්නේ නම් සංවර්ධනය බාධක පසුකරමින් ඒවා ජයගෙන හෝ නව මාර්ග ඔස්සේ ඉදිරියටම ගමන් කළ යුතුවේ. අපේක්ෂා කරනු ලබන තත්ත්වය එසේ වුවත් අප මෙතෙක් ආ ගමන්මග විමසා බැලීමේ දී පෙනී යන්නේ සංවර්ධන ක්‍රියාවලිය ඌනතා, බාධක පසුබෑම් හමුවේ පරිපූර්ණ තත්ත්වයට ළඟා වී නොමැති බවයි. මෙයට පිළියමක් වන්නේ සුදුසු වෙනස්කම් සිදුකරගෙන ඉදිරියට ගමන් කිරීමයි. මෙහිදී ඊට කලින් පැවැති තත්ත්වය මනාව හොඳින් තේරුම් ගැනීම බෙහෙවින් උපකාරී වේ.

## තිරසර සංවර්ධන සංකල්පය

ලෝකයේ පවත්නා අන්ත දරිද්‍රතාවය සහ මූලික අවශ්‍යතා සපුරාගත නොහැකි ජනතාවගේ ජීවන තත්ත්වයන් නංවාලීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීමෙන් 2000 වසරේ දී ලෝකයේ රටවල නායකයින් 2015 වසරේ දී ළඟාකරගත යුතු සංවර්ධන ඉලක්කයන් 08 ක් පිළිබඳ එකඟ වූහ. මේවා සහශ්‍ර සංවර්ධන අරමුණු ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව 2015 වසර වනවිට දරිද්‍රතාවය දුරලීම සම්බන්ධයෙන් වූ අරමුණු අටක් ලඟා කරගැනීමට සැළසුම් කරනු ලැබිණි. මේ එක් එක් අරමුණු දිනාගැනීම වෙනුවෙන් වෙනමම න්‍යායය පත්‍රයන් පැවැතිනි. උදාහරණ වශයෙන් 2015 වසරේ දී සැමට අධ්‍යාපනය ලබාදීම තහවුරු කිරීම සඳහා ලෝක අධ්‍යාපන සමුලුවේදී සම්මත වූ ඩකාර් 2000 ප්‍රකාශනය හැඳින්විය හැකිය. මෙම සහශ්‍ර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ලෝකයේ රටවල් සියල්ලක්ම සාමූහික වශයෙන් උත්සාහ කිරීම

3 වන පිටුවට

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**

K. D පීරිස් මහතා
වජිර උමගලිය මහතා
සුභද්‍රා රාජසිංහ මහත්මිය
ලූර්දුසාමි මහතා

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැවීමට අපේක්ෂා කරනු ලබයි. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධ වීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධානවලට /පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතුවේ

- අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන පළපුරුදු සංවිධානයක් හෝ පුද්ගලයෙක් විය යුතුය
- සංවිධානයක් නම් රජයේ අදාළ ආයතනයන්හි (දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/සමාජ සේවා අමාත්‍යාංශය) ලියාපදිංචි වී තිබිය යුතුය

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර දුරකතන අංක 0112887642 ඔස්සේ අප අමතන්න නැත්නම් අපට ලියන්න අපගේ ලිපිනය

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අංක** 439/6A
**සුදර්ශන මාවත**
**නාවල පාර. රාජගිරිය**

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.

# අධ්‍යාපනයට කරන දායකත්වය අනාගතයට කරන ආයෝජනයක්

**පුත්තලම දකුණු කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්.පී නිමල්සිරි**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කවරකු හෝ කවර සංවිධානයක් විසින් කරනු ලබන දායකත්වයක් වෙත්නම් එය අනාගතය වෙනුවෙන් කරනු ලබන දීර්ඝකාලීන ආයෝජනයක් වන්නේ යැයි පුත්තලම දකුණු කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්.පී නිමල්සිරි මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා එම ප්‍රකාශය කළේ 2017 ජගත් අධ්‍යාපන සතියට සමගාමීව, අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සහාය ඇතිව විනිවිද සංවිධානය, පුත්තලම දකුණු කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය හා එක්ව පුත්/ විල්පොත බණ්ඩාරණායක කණිටු විද්‍යාලේ සියලුම ශ්‍රේණිවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර පැවති චිත්‍ර තරගාවලියේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රධානය කිරීමේ උත්සවයේ දී ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වෙමිනි.

තවදුරටත් කතා කළ ආර්.පී නිමල්සිරි මහතා මෙසේද කීය. පුත්තලම් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන විනිවිද සංවිධානය ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන අධ්‍යාපන සංවර්ධන සන්ධානය හා එක්වෙමින් ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා කටයුතු කිරීම අගය කරනු ලබන බවත් විශේෂයෙන්ම විනිවිද සංවිධානය රාජ්‍ය අංශ හා එක්ව කටයුතු කිරීම දැකිය හැකි විශේෂ ලක්ෂණයක් බවත් පැවසීය.

තිරසර සංවර්ධන අංක 4 අයත් වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයටයි. එහි සඳහන් "සියළු දෙනාම අන්තර්කරණය වූ සමානාත්මතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම හා අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමට" නම් රාජ්‍ය, නිලධාරීන්, ගුරුදෙගුරුන්, ශිෂ්‍ය ශිෂ්‍යායන් මෙන්ම සුභපතන්නන් ද අවබෝධයෙන් යුතුව එක්ව කටයුතු කිරීම වැදගත් වන්නේ යැයි කීය.

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සභාපති කේ.ඩී පීරිස් මහතා, ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 වර්තාව දැනට නිකුත් වෙලා තියෙනවා. ඒ අනුව අවුරුදු 5 - 17 ත් අතර වයස් කාණ්ඩයට අයත් දරුවන් 452661 ක් පාසල් නොයන බවත් ඉන් දරුවන් 51249 ක් කිසිදු පාලකට ගොස් නැති බවත් හෙළිවෙනවා. ඒ වාර්තාවට අනුවම මෙරට ජනගහනයෙන් සියයට 46 ක් හෙවත් 4571442 ක් වයස අවුරුදු 05 ත් 17ත් අතර වයසේ පසුවෙනවා. ඉන් පාසල් යන්නේ 90.1% ක් හෙවත් 4118741 ක් පමණයි.

මේ තත්ත්වය තුළ තිරසර සංවර්ධන අංක 4 වන "සියළු දෙනාම අන්තර්කරණය වූ සමානාත්මතාවයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම හා අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම" අභියෝගයක් ලෙස සමස්ත ශ්‍රී ලංකාවාසී සමාජයම භාරගෙන අවදියෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වන්නේ යැයි ද වැඩිදුරටත් පැවසීය.

මෙහිදී ගුරු උපදේශිකා ජේ. ජෙනීටා ශ්‍රීමතී, විදුහල්පති එම්.එච්.එම් පී සමරජීව, අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ පුත්තලම දිස්ත්‍රික් නියෝජිත මංගල ලාල් සත්කුමාර, ගුරුදෙගුරුන් සමිතියේ ලේකම් ඩබ්.එම්. අජිත් වසන්ත යන මහත්ම මහත්මීන් ද අදහස් දැක්වූහ.

චිත්‍ර තරගයේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග සහ සහතික පත්‍ර බෙදා දීම හා විනිවිද සංවිධානය විසින් විද්‍යාලය වෙත පරිත්‍යාග කරන ලද දල්පන්දු සහ අත්පන්දු ක්‍රීඩාකණ්ඩායම් වෙත පිරිනැමීම ද ආරාධිත අමුත්තන් අතින් සිදුවිය.

හලාවත විශේෂ P.C හෙට්ටිආරච්චි

1 වන පිටුවෙන්

මගින් විශාල ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වී තිබේ. ජනතාවගේ ජීවිතවල සැබෑ වෙනසක් ඇතිකරලීමට සහශ්‍ර සංවර්ධන අරමුණුවලට හැකිවී තිබෙන නමුත් තවත් බොහොමයක් කටයුතු සිදුකිරීමට තිබේ.

වසර 15 අවසානයේ දී එනම් 2015 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වය ඇතිව මෙම අරමුණු දිනාගැනීම සම්බන්ධයෙන් ලබාගෙන ඇති ප්‍රගතිය පිළිබඳ ව සමාලෝචනයක් සිදුකරන ලදී. සංවර්ධන ක්‍රියාවලියේ පවත්නා අසමානතාවයන් මෙන් ම සංවර්ධනයේ දී මානව වර්ගයාට ස්වභාවික සම්පත්වලට සහ පරිසරයට සිදුවන හානි පිළිබඳව කරුණු ගණනාවක් මෙහිදී අනාවරණය විය. මෙම කරුණු පදනම් කරගෙන 2030 වසර වනවිට මානව සුභසිද්ධිය, සෞභාග්‍ය සහ පරිසරය හා අපගේ සමස්ථ ලෝකයේ සම්පත් අනාගත පරම්පරාවට ද ප්‍රයෝජනයට ගත හැකි පරිදි සුරක්ෂිත කරන්නා ආකාරයේ වැඩ පිළිවෙලක් හා සාමයෙන් සහ සාධාරණත්වයෙන් පිරුණු ලෝකයක් බිහිකරලීම සඳහා ළඟාකරගත යුතු සංවර්ධන අරමුණු 17 ක් හඳුනාගන්නා ලදී. එම අරමුණු පශ්චාත් සංවර්ධන න්‍යායය පත්‍රය එසේත් නැත්නම් තිරසර සංවර්ධන අරමුණු ලෙස හැඳින්වේ.

මෙම අරමුණු සහ ඉලක්ක මගින් මීලඟ අවුරුදු 15 තුළදී (2015-2030) මානව වර්ගයා සහ අපගේ ලෝකය සම්බන්ධයෙන් වැදගත් තීරණ හා ක්‍රියාමාර්ග ගැනීම තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ. 2016 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් රැස්වුණු ලෝකයේ රාජ්‍ය නායකයින් මෙම අරමුණු දිනාගැනීමට ක්‍රියාකරන බවත් සංවර්ධන අරමුණු සඳහා වූ ජාතික සැලසුම් සකස් කිරීමේදී මෙම අරමුණු ජයගැනීමට හැකිවන ආකාරයට එම සැළසුම් සකස් කරන බවටත් එකගත්වය පළ කළහ.

## තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු 17 යටතේ ඉලක්ක 169 ක් හඳුනාගෙන ඇත. සහශ්‍ර සංවර්ධන අරමුණුවලදී මෙන් නොව තිරසර සංවර්ධන අරමුණුවලදී සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වය සහ සහයෝගයෙන් මෙම අරමුණු දිනාගැනීමට අපේක්ෂා කෙරේ. මෙහිදි සියලු පාර්ශවයන් ලෙස අදහස් කරන්නේ රජය, පෞද්ගලික අංශය සහ සිවිල් සංවිධානයන්ය. සියලුම රාජ්‍යයන් තම අනාගත සංවර්ධන ක්‍රියාමාර්ග සැළසුම් කරගැනීමේ දී සියලු පාර්ශවයන් සම්බන්ධ කරගනිමින් තිරසර සංවර්ධන වැඩසටහන මගින් ඉදිරිපත් කර තිබෙන අරමුණ සහ ඉලක්කයන් ළඟාකර ගත හැකි අයුරින් අදාළ සැළසුම් සකස්කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තිරසර සංවර්ධන අරමුණු සියල්ලක්ම ඒ ඒ අරමුණු සම්බන්ධයෙන් සුවිශේෂි බවක් දරණ අතර එම අරමුණු සියල්ලක්ම එකිනෙක හා බැඳී පවතී. උදාහරණයක් වශයෙන් අධ්‍යාපන අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා දරිද්‍රතාවය පිටුදැකීම සහ සෞඛ්‍ය තත්ත්වයන් නගාසිටුවීම යන අරමුණු මහත් බලපෑමක් ඇතිකරනු ලබයි.

## තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අවශ්‍යතා සහ නිර්ණායකයන් ඒකාබද්ධ කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම උදෙසා තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය පිහිටුවා ඇත. තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමට අදාළ පනතක් නුදුරු අනාගතයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම පනත මගින් අමාත්‍යාංශ, පළාත් සභා ප්‍රාදේශීය සභා ඇතුලු සියලුම රජයේ ආයතනවලට තිරසර සංවර්ධන උපායමාර්ගයන් සකසා ගැනීමටත් තිරසර සංවර්ධන ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ දර්ශකවලට අනුව විමර්ශන සහ ප්‍රගති වාර්තා සැකසීම අනිවාර්යය වනු ඇත. තිරසාර සංවර්ධන



සහ වනජීවී අමාත්‍යාංශය සියලුදෙනාම "අන්තර්ග්‍රහණය වූ පරිනාමනයක් යන්න තේමා කොටගෙන තිරසාර සංවර්ධන මාර්ග සිතියමක්" සකස් කිරීමේ කාර්යයයේ නියැලී සිටී. මෙයට අමතරව එක් එක් විෂයයන් සඳහා අදාළ අමාත්‍යාංශ තම වැඩසැලසුම්වල දී තිරසර සංවර්ධන අරමුණු දිනා ගැනීම ඉලක්ක කරනු ලබයි. අධ්‍යාපනය සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමේදී ප්‍රමුඛ වගකීම හිමිවන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයටයි.

**තිරසර සංවර්ධන අරමුණු යටතේ අධ්‍යාපනය**

අධ්‍යාපන අරමුණට විශේෂත්වයක් හිමිවන්නේ ඇයි ?

සමාජ පරිනාමනයක් ඇති කරලීමෙහි දී අධ්‍යාපනයට විශේෂ කාර්යයභාරයක් හිමිවේ. සමාජ පරිනාමනයක් ඇති කරලීම සඳහා ජනතාව සිතන පතන සහ හැසිරෙන ක්‍රියාකරන ආකාරයේ වෙනසක් සිදුකිරීමට අවශ්‍ය වේ. මෙම වෙනස්කම් සිදුකළ හැක්කේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කරන්නා වූ අධ්‍යාපනය තුළිනි. එබැවින් අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා අධ්‍යාපන අරමුණු දිනාගැනීමට විශේෂ අවධානයක් යොමුකළ යුතු වේ.

**අධ්‍යාපන අරමුණ පැහැදිලි කිරීම**

ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් ලබා ගැනීම යනු පුද්ගලයන්ගේ ජීවිතය වැඩිදියුණු කර ගැනීමේ සහ තිරසර සංවර්ධනයේ පදනම වේ. පසුගිය කාලසීමාවේ දී විශේෂයෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමුන්ද ඇතුලුව පාසල් යන ළමුන් සංඛ්‍යාව මෙන්ම සියලුම මට්ටම්වල ජනතාවට අධ්‍යාපනය ලබාගැනීම සඳහා අවස්ථාවන් ලබාදීම සම්බන්ධයෙන් සෑහෙන ප්‍රගතියක් අත්කරගෙන තිබේ. මූලික සාක්ෂරතා හැකියාවන් කැපීපෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. නමුත් විශ්වීය අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා තවත් පුලුල් ප්‍රයත්නයන් අවශ්‍යය.

උදාහරණ වශයෙන් සංවර්ධනය වන රටවල පාසල් යන වයසේ සිටින ළමුන්ගේ සංඛ්‍යාව 91% දක්වා ඉහළ ගොස් ඇති නමුත් ළමුන් මිලියන 57 ක් තවමත් පාසල් නොයති.

අප්‍රිකාවේ උපසහරානුකලාපයේ ළමුන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් පාසල් යන්නේ නැත. ලොවපුරා තරුණයින් මිලියන 103ක් මූලික සාක්ෂරතා කුශලතා නොමැතිව සිටින අතර ඔවුන්ගෙන් 60% ක් කාන්තාවන් වේ. ශ්‍රී ලංකාවේ පාසල් නොයන ළමුන්ගේ සංඛ්‍යාව 50000 කට අධිකය.

**තිරසර සංවර්ධන අරමුණ අංක 04 - අධ්‍යාපනය**

ලෝකයේ අධ්‍යාපන තත්වයන් නංවාලීම සඳහා ගෝලීය වශයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග අතුරින් 1990 තායිලන්තයේ ජොම්ටියන් හිදී සකස් කරන ලද සියලුදෙනාට අධ්‍යාපනය ලබාදීම සඳහා වූ වැඩසැලැස්ම, 2000 වසරේ ලෝක අධ්‍යාපන සමුලුවෙන් අනතුරුව සියලු දෙනා සඳහා අධ්‍යාපනය ලබාදීම තහවුරු කරලීම සඳහා වූ ඉදිරිපත් කරන ලද ඩකාර් ප්‍රකාශනය ඉතා වැදගත්වේ. එමෙන්ම 2000 වසරේදී ඉදිරිපත් කරන ලද සහශ්‍ර සංවර්ධන අරමුණුවලදී ද අධ්‍යාපනය නංවාලීම සම්බන්ධයෙන් වැඩ සැලසුම් සහ ඉලක්කයන් අවධාරණය කරන ලදී. 2015 වසරේ මැයි මාසයේදී යුනෙස්කෝ සංවිධානයේ මූලිකත්වයෙන් ලෝක බැංකුව ද ඇතුලුව එක්සත් ජාතීන්ගේ සංවිධාන සමූහයක නියෝජිතයින් රැස්වී මෙම අරමුණු ලඟා කරගැනීමේ ප්‍රගතිය පිළිබඳව කොරියානු සමුහාණ්ඩුවේ ඉන්චියොන් නුවරදී සමාලෝචනයට ලක් කරන ලදී. විවිධ රටවල් හා ජාතීන් වෙත පවරන ලද ඉලක්කයන් සම්පූර්ණයෙන් සපුරා නොමැති බව මෙහිදී අනාවරණය විය. මේ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ අනාගත සංවර්ධන ක්‍රියාමාර්ග යළි සකසා ගැනීම ද අරමුණු කරගෙන යුනෙස්කෝව සමග අදාළ සියලු අංශ සහ රටවල් 184ක සහභාගිත්වයෙන් 2015 දී සංවර්ධන ඉලක්ක 17 යටතේ ඉදිරි වැඩසටහන් සැකසීමේ ප්‍රකාශනය ඉන්චියොන් ප්‍රකාශනය එළිදක්වන ලදී. එහි 04 වන අරමුණ - **සියලුදෙනා අන්තර්කරණය වූ සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපනයක් හා අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීම - 2030 අධ්‍යාපනය යනුවෙන් හැඳින් වේ**

**අංක 04 අධ්‍යාපන අරමුණ යටතේ වූ ඉලක්කයන් සහ අදාළ ඉලක්කයන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන උපනතීන් සමග සැසැඳීමක්**

4.1 2030 වන විට **ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීම හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර සිටීම තහවුරු කිරීම**

ශ්‍රී ලංකාවේ පවතින නිදහස් අධ්‍යාපන ක්‍රමය මගින් මෙරට උපදින සෑම දරුවෙකුගේම අධ්‍යාපනය සඳහා ඇති අයිතිය තහවුරු කර තිබේ. ඒ අනුව ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෑම ළමයෙකුටම ප්‍රාථමික අධ්‍යාපනය ලැබීමටත් ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමටත් සමාන අවස්ථාව හිමි වේ. අවුරුදු 5 - 17 ත් අතර ඇස්තමේන්තුගත මුලු ළමා ජනගහනය මිලියන 4.6 කට ආසන්න වේ. ඉන් 90.1% ක් පාසල් අධ්‍යාපනය ලබන නමුත් **51249**ක් ළමුන් කිසිදා පාසල් නොයයි. (ළමා ක්‍රියාකාරකම් පර්යේෂණය, 2016 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ප්‍රාථමික අධ්‍යාපනයට ළමුන් යොමුවීමේ ඉහළ ප්‍රවනතාවයක් දක්නට ලැබුනත් ද්විතීයික අධ්‍යාපන අවධිය තුළ දී පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමයි අධ්‍යාපනයේ වැඩි අවස්ථා හිමිකර ගන්නා බව පෙනේ. ඒ අනුව ද්විතියික අධ්‍යාපන අවධිය තුළදී පිරිමි ළමුන් අධ්‍යාපනය අතරමග අතහැර ශ්‍රම බලකායට එකතුවන අතර මේ නිසා අධ්‍යාපනය තුළ ස්ත්‍රීපුරුෂභාවය මත යම් විෂමතාවයන් ඇති වෙමින් පවතී. දැනට ශ්‍රී ලංකාවේ අනිවාර්යය අධ්‍යාපනය අවධිය ලෙස සැලකෙන්නේ 1 ශ්‍රේණියේ සිට 9 වන ශ්‍රේණිය දක්වාය. විශේෂයෙන්ම රැකියාවක් ලබා ගැනීමේ දී අවම අධ්‍යාපන සුදුසුකම වශයෙන් අ.පො.ස සාමාන්‍ය පෙළ සමත්වීම සළකනු ලබයි. ශ්‍රී ලංකාවේ අනිවාර්ය අධ්‍යාපනය 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දීර්ඝ කිරීම පිළිබඳව රජයේ අවධානය යොමු වී ඇති අතර එමගින් අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් ඇතිවෙමින් පවතින විෂමතාවය අවම කරගත හැකිවනු ඇත.

**4.2** 2030 වන විට **සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ මුල් ළමාවිය සංවර්ධනයට, සත්කාර සහ මුල් ළමාවිය අධ්‍යාපනයට ප්‍රවේශවීමට අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන්ට ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටීම**

අධ්‍යාපන ක්‍රමවේදය තුළ පෙරපාසල් අධ්‍යාපනය සුවිශේෂී සන්ධිස්ථානයක් ගනු ලබන අතර ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දරුවන් හුරුකරනුයේත් ඒ සඳහා වන උත්තේජනය ඇතිකරන ලබන්නේ පෙර පාසල් අධ්‍යාපනය තුළිණි. ඒ හේතුවෙන් මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ දී පෙරපාසල් ගුරුවරුන් වෙත ඉමහත් වගකීමක් පැවරෙන නමුත් ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් සම්මත විෂයය නිර්දේශයක් ක්‍රියාත්මක වන්නේ නැත. විධිමත් විෂය නිර්දේශයක් යටතේ දරුවා හුරු නොකිරීම හේතුවෙන් එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් යම් යම් ගැටළු මතු වී තිබේ. එනම් රටපුරා පෙරපාසල්වල දරුවන් විවිධ විෂය නිර්දේශයන් යටතේ අසමානාත්මතාවය මත සංවර්ධනය වීම සිදු වේ. මුල් ළමාවිය සංවර්ධනයේ පරමාර්ථය වන්නේ ළමයා විධිමත් පාසල් අධ්‍යාපනය ක්‍රියාවලියට ඇතුළත්වීමට අවශ්‍ය වන්නා පදනම දැමීමයි. ළමා සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධිත ජාතික ළමා ලේකම් කාර්යාලය විසින් පසුගිය වසරේදී මුල් ළමාවිය සංවර්ධන

ප්‍රමිතීන් හඳුන්වාදෙන ලදී. මෙම ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක වීම සිදුනොවන අතර තවමත් මෙම ප්‍රමිතීන් මැනබැලීමේ මෙවළම් සංවර්ධනය කර නොමැත. මෙම තත්වය මගින් මෙරට පෙරපාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳව ගැටලුකාරී තත්වයන්ට මගපාදයි. මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් හා එයට අදාළ ක්‍රියාකාරකම් නිසි අන්දමින් ක්‍රියාත්මක කිරීම තුළින් මුල් ළමාවිය සංවර්ධනයට දායක වන පෙරපාසල් අධ්‍යාපනය නියමිත පරිදි ප්‍රමිතිගත කර මෙම අභියෝගය ජයගත හැකිය.

**4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට විශ්ව විද්‍යාල අධ්‍යාපනයද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම**

සෑම වසරකම පාසල් අධ්‍යාපන පද්ධතියට පළමු වසර සඳහා ළමයින් ලක්ෂ 3 - 4 ක ප්‍රමාණයක් ඇතුළත් වුවද ඉන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවස්ථාව හිමිවන්නේ මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 20% ක් පමණ වූ සුළු පිරිසකටය. "2015 වර්ෂයේ ශිෂ්‍යයන් 26000 ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේ දළ අනුපාතය අනෙකුත් රටවල් හා සැසඳීමේදී 17% කට වඩා අඩු අගයක් ගනී. සංඛ්‍යා දත්ත අනුව හෙළිවන්නේ 150,000-200,000 අතර වන ශිෂ්‍ය ප්‍රජාවගෙන් 35,000 කට ආසන්න සිසුන් ප්‍රමාණයක් විවෘත විශ්වවිද්‍යාලය, විදේශ විශ්වවිද්‍යාල හෝ රජයේ නොවන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල උසස් අධ්‍යාපන පහසුකම් ලබන බවයි. (දිණමින, 2016 නොවැ.11) ඒ අනුව වසරකට දළ වශයෙන් 60000 ක් පමණ උසස්පෙළ සමතුන් (17%ක්)උසස් අධ්‍යාපනයට යොමුවන අතර 140000 කට ආසන්න උසස්පෙළ සමතුන් තම අධ්‍යාපනය එතැනින් නවතා දමනු ලබයි.

විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය රටේ සංවර්ධන ක්‍රියාවලිය හා සාපේක්ෂව ගමන් කළ යුතු අතර සාම්ප්‍රදායික විෂය නිර්දේශ නවීන තාක්ෂණය සහ ගෝලීය අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි වෙනස් විය යුතුය. උසස් පෙළින් මග හැරෙන්නා වූ ළමයින්ට සුදුසු වෘත්තීය පුහුණුවක් හෝ රැකියා මාර්ගයක් උදාකර ගැනීමට හැකිවන පරිදි අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනස් විය යුතුය. තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාල මෙන්ම පෞද්ගලික විශ්වවිද්‍යාල වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර පෞද්ගලික විශ්වවිද්‍යාලවල ප්‍රමිතිය සම්බන්ධයෙන් රජය නිසි ඇගයීම සහ නියාමනයන් සිදුකළ යුතුය.

**4.4 2030 වන විට අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම්වලින් යුත් අවශ්‍ය කුසලතා ලබාසිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම**

විවිධ අවධීන්වල දී පාසල් පද්ධතියෙන් ඉවත්වන ළමයින් 80% ක් පමණ පිරිස ශ්‍රම බලකාය තුළ විශේෂ හැකියාවන්ගෙන් යුත් පිරිසක් බවට පත්කිරීමේ ක්‍රියාවලියේ දී රජයට හිමිවන්නේ විශාල වගකීමකි. 2015 ශ්‍රී ලංකාවේ විරැකියාවේ අනුපාතය පිළිබඳ අවධානය යොමු කිරීමේදී අ.පො.ස උසස් පෙළ සහ ඉන් ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා ඇති කාන්තාවන් 13.5% ක් ද පුරුෂයන් 4.7% ක් රැකියා විරහිතභාවයෙන් පෙළෙන බව වාර්තා වී ඇත.(ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2015)

සෑමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම යථාර්ථයක් කිරීමට රජය කැප වී ක්‍රියාකළ ද රැකියාවන් සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීමේ ක්‍රියාවලිය තුළ තවමත් රජය පසුගාමී තත්ත්වයක පසුවේ. ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය ලබාදෙන ආයතන අමාත්‍යාංශ මට්ටමෙන් 04ක් (VTA, NAITA,DTET,German Tech) ද විශ්වවිද්‍යාල මට්ටමෙන් ආයතන 3ක් (සාගර විශ්වවිද්‍යාලය, තාක්ෂණික විශ්වවිද්‍යාලය, NSBM) ද පවත්වාගෙන යන ලබන අතර ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා (NVQ) 736 ක් දැනටමත් පවත්වාගෙන යන නමුත් නිපුණතා පරතරයක් හෙවත් පුහුණු ශ්‍රමයේ හිඟතාවයක් පවතී. සාම්ප්‍රදායික වෘත්තීය පාඨමාලා වෙනුවට ගෝලීය අවශ්‍යතාවන්ට ගැළපෙන නව පාඨමාලා එනම් ආහාර තාක්ෂණය සහ කළමනාකරණය, සංචාරක කළමනාකරණය, තොරතුරු තාක්ෂණය ආදී නව පාඨමාලාවන් වෘත්තීය පුහුණු ආයතන තුළ මෙන්ම පාසල් සහ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ද ඇතිකිරීම හරහා න්‍යායික අධ්‍යාපනය පමණක් නොව වැඩකිරීමේ කුශලතා ඇති ශ්‍රමබලකායක් බිහිකිරීම මගින් ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත්කළ හැකිය.

**4.5 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශවීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට, ආදිවාසී ජනතාවට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනීමට අවස්ථාව සැලසීම**

විවිධ මානව ක්‍රියාකාරකම් සහ පාරිසරික හේතූන් මත ආබාධිත තත්ත්වයට පත්වන පිරිස දිනෙන් දිනම ඉහළ යන බව වාර්ෂික සංඛ්‍යා ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනී යයි. ලංකාව පුරා දෘශ්‍යාබාධිත උපාධිධාරීන් 300ක් පමණ සිටින අතර සිය අධ්‍යාපනය



නිම කළද රැකියා සඳහා යොමු කිරීමේදී දෘශ්‍යාබාධිත ප්‍රජාව නොසළකා හරින තත්ත්වයක් තවදුරටත් දැකිය හැකිය. නමුත් ඇතැම් පුද්ගලයන් ස්වයං රැකියා තුළින් සමාජයේ ඉහළ මට්ටමකට පැමිණ තිබෙනු දැකගත හැකි අතර මෙලෙස අබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් තවදුරටත් සමාජයේ ආන්තිකරණය වීම වළක්වමින් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා විධිමත් වෘත්තීය අධ්‍යාපනයක් ඔවුන්ට ලබා දිය යුතුය. ආබාධිත පුද්ගලයින්ට ස්වශක්තියෙන් නැගී සිටිය හැකි පරිදි ජීවන කුසලතා නංවාලීම සඳහා වූ පාඨමාලා ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් පවතී. එසේම පාසල්වලින් ඈදහැලෙන සහ රැකියා කරන අතරතුර අධ්‍යාපනය ලබාගත හැකි මාර්ග හඳුනාදීමේ සහ ක්‍රියාමාර්ග දිරිගැන්විය යුතු වේ.

**4.6** 2030 වන විට **සියලුම තරුණයින් සහ කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම**

ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය අනෙක් රටවලට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතින අතර එය තුන්වන ලෝකයේ රටකින් බලාපොරොත්තු වන මට්ටමට වඩා වැඩි 92.64% ක සාක්ෂරතා මට්ටමකි. ඒ අනුව රටේ ජන ජීවිතය සහ සංස්කෘතිය තුළ අධ්‍යාපනය විශාල භූමිකාවක් රඟදක්වන බව පෙනේ. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ගැන සතුටුවිය හැක්කේ එය 92.64% ක් වන නිසා නොව ස්ත්‍රී පුරුෂ සාක්ෂරතාවේ පරතරය ඉතා අවම අගයක් ගන්නා නිසාය. ලංකාවේ ස්ත්‍රීන්ගේ සාක්ෂරතා මට්ටම 91.71% ක් වන අතර පුරුෂයන්ගේ සාක්ෂරතාවය 93.63% කි. නමුත් 2016 "ළමා ක්‍රියාකාරකම් පර්යේෂණ වාර්තාව"ට අනුව ශ්‍රී ලංකාවේ සිටින ළමුන්ගෙන් 452661 ක් පාසල් නොයන බවත් එයින් 51249 ක් කිසිදා පාසල් නොගොස් ඇති බවත් අමතක නොකළ යුතු ය.

ලිවීමේ, කියවීමේ හැකියාව පැවතුන ද නූතන ගෝලීය ආර්ථිකය අපේක්ෂා කරන තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් තවමත් අප පසුවන්නේ පසුගාමී තත්ත්වයකය. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව දක්වන ආකාරයට "2016 වර්ෂයේ අවුරුදු 25 - 29 ත් අතර ජනගහනයේ පරිගණක සාක්ෂරතාවය 43.1% කි. පරිගණක සාක්ෂරතාවය වැඩිම පළාත බස්නාහිර පළාත ලෙස (44.1%) ක් ලෙස වාර්තා වී ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ අන්තර්ජාල භාවිතය 28.1% ක් වන අතර ඊ - මේල් භාවිතය 21.9% ක් බව පෙනී යයි" (ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2016)

**සංවර්ධනය වන රටවල පාසල් යන වයසේ සිටින ළමුන්ගේ සංඛ්‍යාව 91% දක්වා ඉහළ ගොස් ඇති නමුත් ළමුන් මිලියන 57 ක් තවමත් පාසල් නොයති.**

ඒ අනුව සාක්ෂරතාවය යම්කිසි වයස් සීමාවකදී ලිවීමට හා කියවීමට ඇති හැකියාව ලෙස ගෙන දක්වනු ලැබේ. ලිවීමේ කියවීමේ හැකියාව අතින් අප සතුටුදායක තත්වයක සිටින බවට වාදයක් නැත. ජීවත්වත් වීමට මුදල් අවශ්‍යව ඇති අර්ථ ක්‍රමයක සෑම පුද්ගලයකුටම රැකියාවක නිරත වීම අනිවාර්ය වේ. අප ලබන ප්‍රාථමික අධ්‍යාපනයත්, ද්විතීයික අධ්‍යාපනයත් රැකියා ඉලක්ක කරමින්, රැකියා කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් කැපවිය යුතුය. මේ තත්වය මත අපගේ ව්‍යවහාර සාක්ෂරතාවය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග පිළිබඳව දැඩි අවධානය යොමුකළ යුතුවේ.

**4.7** 2030 වන විට **ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, මේවාට තිරසාර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම් සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, විශ්ව පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම ඇතුළත් වේ**

තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමේ දී රාජ්‍ය පෞද්ගලික සහ සිවිල් ජනතාව යන තෙපාර්ශවයේම සම්බන්ධීකරණය සහ පාර්ශවකරණය අත්‍යාවශ්‍ය වේ. මෙම අරමුණු පවත්නා සම්බන්ධතාවයන් වටහා ගැනීමක් සමාජ පරිනාමයක් තුලින් ලෝකයේ ධනාත්මක වෙනසක් කරා යාම සියලුදෙනාගේ සහභාගිත්වයෙන් සිදුවිය යුත්තකි. එහෙත් තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව පොදු ජනතාව තුළ පමණක් නොව එම අරමුණු පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ වගකීමක් දරන්නා වූ රාජ්‍ය නිලධාරීන් තුළ පවා ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය කළ හැකිය. මෙම නිසා සියලු පුරවැසියන් විසින් දරන්නාවූ වගකීම සහ ඔවුන් ඒ වෙනුවෙන් ක්‍රියාකිරීමට පෙළගැස්සවීම සඳහා සක්‍රීය දැනුම්වත් කිරීමේ ව්‍යාපාරයක අවශ්‍යතාවයක් තිබේ.

**උප අරමුණු**

4 අ. ළමයින් විශේෂ අවශ්‍යතා ඇති අය සහ ස්ත්‍රී පුරුෂ යන තත්වයන් ගැන සැලකිලිමත් වූ අධ්‍යාපන පහසුකම් සහ සැමටම ආරක්ෂාව,අවිහිංසාව, අන්තර්කරණය සහිත සහ ඵලදායී ඉගෙනුම් පරිසරයක් වැඩි දියුණුකිරීම හා ගොඩනැගීම.

4 ආ. 2020 වන විට දියුණු සහ සමහර දියුණු වෙමින් පවතින රටවල වෘත්තීය පුහුණු හා තොරතුරු,තාක්ෂණ, ඉංජිනේරු සහ විද්‍යාත්මක වැඩසටහන් ඇතුලු උසස් අධ්‍යාපනය සඳහා විශේෂයෙන් අප්‍රිකානු සහ දියුණු වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්ට, අවම දියුණුවක් ඇති රටවල්වලට ලබාදෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව ඉහළ නැංවීම

4 ඇ. 2030 වන විට සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යවල සහ විශේෂයෙන් ඌන සංවර්ධිත හා කුඩා දූපත් රාජ්‍යවල ගුරුවරුන් පුහුණුව සඳහා ජාත්‍යන්තර සහයෝගය ලබාදීම මගින් සුදුසුකම් සහිත ගුරුවරුන් සැපයීම සැලකිය යුතු මට්ටමකින් ඉහල දැමීම

**තිරසර සංවර්ධන අරමුණු අංක 04 අධ්‍යාපන අරමුණ ලගාකර ගැනීම සඳහා අපගේ කාර්යයභාරය හා වගකීම**

තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීම සඳහා ක්‍රියාකිරීම සියලුදෙනාගේම වගකීමක් වේ. මේ සඳහා තිරසර සංවර්ධන අරමුණු සහ එහි ඉලක්කයන් පිළිබඳව හොඳින් දැනුම්වත්වීම අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකාවද මෙම අරමුණු දිනාගැනීම සඳහා කැපවී ක්‍රියාකරන බවට අන්තරජාතික ප්‍රඥප්තීන්ට අත්සන් තබා ඇති බැවින් මෙම ක්‍රියාවලියේ පාර්ශවකරුවන් වීමට පුරවැසියන් වශයෙන් අපට අයිතියක් ඇත. ඒ සඳහා අප රජය විසින් ගනු ලබන්නා වූ ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් විමසිලිමත් වීම ප්‍රශ්න කිරීම සහ අදහස් දැක්වීම සිදුකළ යුතු වේ.

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අංක 439/6A**
**සුදර්ශන මාවත**
**නාවල පාර**
**රාජගිරිය**



# ලොව අංක එක බවට පත්වූ ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය

"සියලුම පුද්ගලයන් උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලැබිය යුතුය" යන්න මූලික මුලධර්මය කරගත් ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය ලෝක අධ්‍යාපනය සඳහා වූ පියර්සන් දර්ශකයේ ඉහළම ස්ථානයේ පසු වේ. දෙවන ලෝක යුද්ධයේ විනාශකාරී ප්‍රතිඵල අත්විඳි රටක් වුවද අද වනවිට ඉහළම සංවර්ධනයක් අත්පත් කරගෙන තිබෙන ෆින්ලන්තය ලෝකයේ බොහෝ දෙනාගේ කතාබහට ලක්වනුයේ එරට අධ්‍යාපන ක්‍රමය නිසාය. "සැමට අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම" යන්න මූලික පරමාර්ථය කරගත් එරට අධ්‍යාපන ක්‍රමය සාම්ප්‍රදායික බවේ සමහර අංග මුලිනුපුටා ශිෂ්‍යාට උපරිම නිදහසක් සහ පහසුවක් ලැබෙන පරිදි නිර්මාණය කරන ලද එකකි. එමනිසා වාර්ගිකත්වය, වයස හෝ ස්ත්‍රීපුරුෂ භේදයකින් තොරව සියලුම පුරවැසියන්ට අධ්‍යාපනයේ සම අයිතිවාසිකම් හිමිවනවා මෙන්ම පූර්ව ප්‍රාථමික අවධියේ සිට උසස් අධ්‍යාපනය දක්වා දරුවන්ට නොමිලයේ අධ්‍යාපනය හිමි වේ. World Top 20 Network මගින් සිදුකරන ලද "ලොව හොඳම අධ්‍යාපන ක්‍රමයන් 20" තේරීමේ වැඩසටහනට අනුව 2017 වර්ෂයේ පළමු කාර්තුවේ ලොව හොඳම අධ්‍යාපන ක්‍රමය ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය බව ඇගයීමට ලක්කරමින් එය අනෙකුත් රටවලට යොදාගත හැකි පරමාදර්ශී අධ්‍යාපන ක්‍රමයක් බව පෙන්වාදෙන ලදී.

සමාජ පරිනාමනයක් ඇති කිරීමේදී අධ්‍යාපනයට විශේෂ කාර්යභාරයක් හිමි වේ. එය කළ හැකි වන්නේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කරන්නා වූ අධ්‍යාපනයක් තුළිණි. ලොව බොහෝ රටවල් අද දියුණු ඒවා බවට පත්වී තිබෙන්නේ එම රටවල සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය තුළ සිදුකරන ලද සාධනීය වෙනස්කම් හරහාය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රමාණාත්මක පැතිරීම කෙරෙහි සතුටුවිය හැකි නමුත් එහි ගුණාත්මකභාවය කෙරෙහි සතුටු විය නොහැකි වන්නේ අධ්‍යාපන ක්‍රමය තුළ පවතින සාම්ප්‍රදායික බව නිසාය. නමුත් ෆින්ලන්තයේ තිබෙන අධ්‍යාපන ක්‍රමය තුළින් එරට සමාජයේ පවතින ගැටළු රැසකට පිළිතුරු සපයයි. අධ්‍යාපනයේ අවසාන අරමුණ විය යුත්තේ එයය.

### නව අවුරුදු මූලික අධ්‍යාපනය

ඒ අනුව සෙසු රටවලට සාපේක්ෂව ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය තුළ දැකිය හැකි සුවිශේෂිතා රැසකි. නව අවුරුදු මූලික අධ්‍යාපනය සෑම ෆින්ලන්ත දරුවෙකුටම අනිවාර්ය වේ. අපේ රටේ දරුවෙකු 1 වසරට ඇතුළත් කරගනුයේ වයස අවුරුදු 6 දී වුවද ෆින්ලන්තයේ නම් වයස අවුරුදු හත සම්පූර්ණ කර තිබිය යුතුය. ඒ අනුව අවුරුදු හය වනතෙක් දරුවන්ට ළමා කාලය උපරිම නිදහසෙන් ගත කිරීමට අවකාශය ලැබෙන අතර අවුරුදු 17 දී පවත්වන ලද පොදු පරීක්ෂණයත් සමග ඔවුන්ගේ නව අවුරුදු මූලික අධ්‍යාපනය අවසන් වේ. මූලික අධ්‍යාපනය ලබන කාලය තුළ පාසල් පොත් සහ උපකරණ ඇතුළු සියලුම අධ්‍යාපනික භාණ්ඩ මෙන්ම දිවා ආහාරය ෆින්ලන්ත රජය විසින් නොමිලේ සපයයි. දිනකට පාසල තුළ උගන්වනු ලබන්නේ විනාඩි 45 කාලච්ඡේද 5ක් පමණි. ඒ අනුව ෆින්ලන්ත ළමයෙකු දිනකට පන්තිකාමරය තුළ ඉගෙනගනු ලබන්නේ පැය 3 කුත් විනාඩි 45ක කාලයකි. වසරකට පාසල් දින 190කට සීමා කර ඇත. ඒ අනුව ෆින්ලන්ත ළමයින්ගෙන් මූලික අධ්‍යාපනය සාර්ථකව නිමකරන පිරිස 99.7%ක් තරම් ඉහළ අගයක් ගනියි.

### කුසලතා කේන්ද්‍රීය අධ්‍යාපනය

ෆින්ලන්ත අධ්‍යාපන ක්‍රමය තුළ දැකිය හැකි තවත් සුවිශේෂී ලක්ෂණයක් වනුයේ සිසුන්ගේ හැකියාවන් උපරිම අවදිකිරීමට හැකිවන පරිදි විෂය නිර්දේශයන් නම්‍යශීලී වීමයි. එසේම ළමයින්ගේ කුසලතා අවදිකිරීම සඳහා උපදේශන වැඩසටහන් පවත්වයි. එමගින් ළමයින්ට සහ තරුණ පරපුරට ඔවුන්ගේ හැකියාවන් මොනවාද යන්න හඳුනා ගැනීමට මහත් රුකුලක් සපයනවා මෙන්ම අනාගත වැඩ ලෝකයට පිවිසීමේදී තමාට සුදුසු රැකියාව පිළිබඳ නිවැරදි තීරණ ගැනීමට එමගින් හැකියාව ලැබේ.

### ද්විතියික අධ්‍යාපනය

මූලික අධ්‍යාපනය වසර 9 සාර්ථක ලෙස නිම කළ සිසුන් ද්විතියික අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබයි. ඒ අනුව ඉහළ ද්විතියික අධ්‍යාපන විෂය නිර්දේශය වසර තුනකට සැළසුම් කර ඇත. එය වසර දෙකකින් හෝ උපරිම වසර හතරකින් සම්පූර්ණ කළ හැකිය. ඉහළ ද්විතියික අධ්‍යාපනය අවසන් වනවිට ෆින්ලන්ත සිසුවෙකුට එරට අධ්‍යාපන ක්‍රමය යටතේ පවතින එකම ජාතික විභාගය වන "මැට්‍රිකියුලේෂන් විභාගයට" පෙනී සිටිය යුතුය.

එසේම ෆින්ලන්තයේ ගුරු වෘත්තීය යනු ආකර්ශණීය වෘත්තීය තෝරාගැනීමක් වුවද ගුරුවරයෙකු වීම එතරම් පහසු කටයුත්තක් නොවේ. මුල් ළමාවිය අධ්‍යාපනයේදී ගුරුවරයෙකු ප්‍රථම උපාධිය සම්පූර්ණ කර තිබිය යුතු අතර ප්‍රාථමික අධ්‍යාපනයේ නිරත ගුරුවරයෙකුට පශ්චාත් උපාධියක් තිබිය යුතුය. ඊට අමතරව ගුරු වෘත්තියට ප්‍රවිෂ්ට වන සෑම ගුරුවරයෙකු තුළම මනෝවිද්‍යාව පිළිබඳ දැනුම තිබිය යුතුය. එමෙන් පින්ලන්තයේ දළදේශීය නිෂ්පාදිතයෙන් 7% ක් එරට අධ්‍යාපනය සඳහා වියදම් කරයි.

ඒ අනුව ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය තුළ සියලුම පාසල් එකම තත්ත්වයෙහි ලා සැළකෙන අතර දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලුම දරුවන්ට අධ්‍යාපනයේ සම අවස්ථාවන් හිමි වේ. තරගකාරීත්වය සහ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් ඔබ්බට ගිය අධ්‍යාපන ක්‍රමවේදය හරහා දක්ෂතාවයෙන් අඩු දරුවන් පවා ක්‍රමයෙන් එකම තලයකට ගෙන ඒමට හැකි වේ. එමෙන් ම ෆින්ලන්ත රජයේ ගුරුවරයෙකු තුළ විෂය පිළිබඳ හසල දැනුමක් මෙන්ම මනෝවිද්‍යාව පිළිබඳ ඇති දැනීම නිසා පන්ති කාමරය දරුවන්ට ප්‍රියජනක ස්ථානයක් බවට පත්කිරීමට හැකි වී තිබේ.

ශ්‍රී ලංකාව වැනි මැදි ආදායම් ලබන රටකට ෆින්ලන්ත අධ්‍යාපන ක්‍රමය එලෙසින්ම ක්‍රියාත්මක කළ නොහැකි වුවත් එහි යම් යම් අංග අපේ අධ්‍යාපන ක්‍රමවේදය තුළට ඇතුළත් කිරීම තුළින් එහි පවතින සාම්ප්‍රදායික බව බිඳහෙළිය හැකිය. සියලුම පාසල් එකම තලයෙහි ලා සැළකීම, වාර්ෂිකව අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන මුදල් ඉහළ දැමීම, ගුරුවරුන්ට විෂය දැනුමට අමතරව මනෝවිද්‍යා දැනුම ලබා දීම, පාසල තුළ ප්‍රධාන විෂයන්ට අමතරව වෘත්තීය පුහුණුව ලබා දීම සහ විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය සහ විභාග මානසිකත්වයෙන් ළමා මනස මුදවාගැනීම වැනි ක්‍රමවේද හරහා අපේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ හැකිය.

**දිනිති අලහප්පෙරුම**
**වැඩසටහන් සහකාරිනී**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

# ඉගෙනුම් ආබාධිත ළමයි

"මගේ ළමයා චිත්‍ර, නැටුම්වලට දක්ෂයි. පාසලේ අනෙක් විෂයන්වලට දුර්වලයි. මේ ළමයා හදා ගන්නට මට උදව් කරන්න"

"මගේ ළමයා ගණිතයට පමණක් අඩු ළකුණු ගත්තාට අනෙක් විෂයයන්වලට දක්ෂයි"

"මගේ ළමයා භාෂාවටත් ගණිතයටත් පමණයි අඩු ළකුණු ගන්නේ"

"මේ ළමයාගේ ගතිගුණ සිරිත්විරිත් සියල්ලම හොඳයි. නමුත් පාසලේ සමහර විෂයන්වලට දුර්වලකමක් පෙන්වනවා"

තම ළමුන් ගැන මෙවැනි අදහස් පළකරන දෙමව්පියන් මෙන්ම ගුරුවරුන් ගැනද ඔබ කොතෙකුත් අසා ඇත. පාසලක එක් පන්ති කාමරයක් තුළ ඉහත කී ලක්ෂණ දක්නට ලැබෙන සිසුන් දෙතුන් දෙනෙකුවත් සිටීම සුලබ කාරණයකි.

මෙවැනි ළමුන් හමු වූ විට ප්‍රවීන ගුරුවරුන් විසින් ගනු ලබන ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් අප දැක ඇත. එකක් නම් එම ළමුන් වෙන්කර හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් විශේෂිත ඉගැන්වීම් ක්‍රම යොදාගෙන ඔවුන් ඔසවා තැබීමට උත්සාහ කිරීමයි. දෙවැන්න වන්නේ හඳුනාගත් එම ළමුන් විශේෂ දක්ෂතා සහ හැකියාවන් සහිත ගුරුවරුන් වෙත යොමු කර ඔවුන්ට උපකාර කිරීමට සැළැස්වීමයි.

නිර්දය ලෙස එම ළමුන්ට අපහාස කිරීමත්, නම් පටබැඳ එම ළමුන් පන්ති කාමරයෙන් වෙන්කර තැබීමටත් පුරුදු වූ ගුරුවරුන් ගැන අතීතයේ දක්නට ලැබුණ ද වර්තමාන ගුරුපරපුර ඊට වඩා ඉදිරියෙන් සිටින බව පැවසිය හැකිය.

මෙවැනි ළමුන් සමූහ උපකාරක පන්තිවලට යැවීමෙන් ද ඵලක් නොවන බව පැවසිය යුතුය. එවැනි පන්තිවල උගන්වන ඇතැම් අය තමන්ගේ දක්ෂකම් පෙන්වීමට එවැනි ළමුන්ගේ දුර්වල විෂයන්වලට ව්‍යාජ වැඩි ළකුණු යොදා පෙන්වා දෙමව්පියන්ගේ සිත් සනසන අවස්ථාද අප දැක ඇත. එසේ වුවහොත් ඔවුන්ට අවැඩක් මිස ඵලක් සිදු නොවනු ඇත.

මෙවැනි ඉගෙනුම් ආබාධිත ළමුන් පිරිසක් සමග දීර්ඝ කාලීන පර්යේෂණ සිදුකළ ඇල්ෆ්‍රඩ් ස්ට්‍රවුස් හා හෙන්ස් වර්නර් යන දෙදෙනා මෙවැනි ළමුන් ඇති වීමට හේතු කිහිපයක් දක්වා ඇත.

යම් ළමයෙකු ඉගෙනුම් ආබාධිතයෙකු බව නියත වශයෙන්ම නිගමනය කර ගත් පසු ඒ ළමයා විශේෂ අවශ්‍යතා ඇති ළමයෙකු ලෙස හඳුනාගෙන ඊට අවශ්‍ය ප්‍රතිකාරක ඉගැන්වීම් ක්‍රම යෙදීම හෝ ඒ සඳහා පහසුකම් සැළසීම දක්ෂ ගුරුභවතෙකුගේ කාර්යභාරය වන අතර දෙමව්පියන්ද මේ පිළිබඳව උපේක්ෂා සහගතව, ඉවසීමෙන් හා විමර්ශනශීලීව කටයුතු කළ යුතුය.

1. දරු උපත්වලදී සිදුවන අත්වැරදි හේතුකොට ගෙන ඇතිවිය හැකි මස්තිෂ්ක ආබාධ
2. දරුවා මව් කුස තුළ සිටිය දී ඇතිවන ආපදා හේතුවෙන් දරුවාගේ මොළයට ඇතිවිය හැකි ආබාධ
3. ළදරු හෝ ළමා අවධිවල සිදුවිය හැකි අනතුරු හේතුවෙන් හිසට සිදුවන ආබාධ
4. ආරමය සාධක

ඉහත කරුණු සළකා බැලූ විට පැහැදිලි වන්නේ ඉගෙනුම් ආබාධිත බව සඳහා බලපාන ප්‍රධාන සාධකය නම් දරුවාගේ හිසට සිදුවන යම් ආපදාවක් හේතුවෙන් මොළයේ ස්නායු පද්ධතියක ඇතිවිය හැකි විකෘති තත්ත්වයක් බවයි. ආරමය සාධක ද ඇතැම් විට බලපෑ හැකිය.

වැලට් (Vallett) නැමැති මනෝවිද්‍යාඥයා ඉගෙනුම් ආබාධිත දරුවන්ගේ ලක්ෂණ මෙසේ විස්තර කරයි.

දීර්ඝ කාලයක් තිස්සේ පාසලේ ශාස්ත්‍රීය විෂයක් කෙරෙහි දක්වන අසමත් බව. ප්‍රධාන වශයෙන් මෙහි ශාස්ත්‍රීය විෂයන් ලෙස ගණිතය සහ මව්බස සැළකිල්ලට ගනු ලැබේ. මෙහි දී අඩු වශයෙන් වසරක කාලයක් තුළ එම විෂයන් දෙකට පාසල් විභාගවල දී ගනුලබන ළකුණු ප්‍රමාණය 0 - 20 අතර වී නම් එය ඉගෙනුම් ආබාධිත බවේ ලක්ෂණයක් ලෙස සළකනු ලැබේ.

ළමයා ශාස්ත්‍රීය විෂයන්වලට ගනු ලබන ළකුණු ප්‍රමාණය අඩු වුව ද නැටුම්, සංගීත වැනි ප්‍රායෝගික විෂයන්වල දී වැඩි ළකුණක් ගනු දැකිය හැකිය.

බැලූ බැල්මට අනෙක් ළමයින් මෙන් මෙම ළමයින් ද ශරීර ලක්ෂණවලින් හා ගතිගුණ ආදියෙන් සමානතා පෙන්වුව ද ඇතැම් ළමයින්ගේ එතරම් ප්‍රදර්ශනය නොවන කන් ඇසීමේ දුර්වලතා හා ඇස් පෙනීමේ දුර්වලතා වැනි දේ පැවතිය හැකිය.

ශාස්ත්‍රීය විෂයන්වලට නිරන්තර දුර්වල වීමත් ඒ හේතුව නිසා පන්තිකාමරයේ ළමුන් හා ගුරුවරුන් මෙම ළමයින් කෙරේ දක්වන හීන ආකල්පත් හේතුවෙන් මෙම ළමයින් උකටලී ස්වභාවයන් හා අඩු පෙළඹවීම් ස්වරූපයන් පෙන්නුම් කළ හැකිය. (දක්ෂ ගුරුවරුන්ට මෙම තත්ත්වය නිශේධනය කළ හැකිය)

පංති කාමරයේ මෙවැනි ළමුන් දක්නට ලැබුනහොත් එම ළමයින් ගැන දීර්ඝකාලීනව සොයා බැලීමකින් පමණක් ඒ බව නිගමනය කළ යුතුය. එයට හේතුව වන්නේ යම් පාරිසරික හේතුවක් නිසා ඇතැම් ළමුන් කෙටි කාලයේ දී මෙවැනි ලක්ෂණ පෙන්නුම් කර පසුව යථා තත්ත්වයට පත්වන හෙයිනි.

යම් ළමයෙකු ඉගෙනුම් ආබාධිතයෙකු බව නියත වශයෙන්ම නිගමනය කරගත් පසු ඒ ළමයා විශේෂ අවශ්‍යතා ඇති ළමයෙකු ලෙස හඳුනාගෙන ඊට අවශ්‍ය ප්‍රතිකාරක ඉගැන්වීම් ක්‍රම යෙදීම හෝ ඒ සඳහා පහසුකම් සැළසීම දක්ෂ ගුරුභවතෙකුගේ කාර්යභාරය වන අතර දෙමව්පියන්ද මේ පිළිබඳව උපේක්ෂා සහගතව, ඉවසීමෙන් හා විමර්ශනශීලීව කටයුතු කළ යුතුය.

මෙවැනි ළමයෙකු පිළිබඳ ගුරුවරුන් හෝ දෙමව්පියන් කළබළ විය යුතු නොවන්නේ මෙවැනි ඉගෙනුම් ආබාධ සහිත දරුවන් ශාස්ත්‍රීය විෂයන්වල දුර්වලතාවයන් පෙන්නුව ද අනාගතයේ යහපත් පුරවැසියන් වනවා පමණක් නොව දක්ෂ වෙළඳ ව්‍යාපාරිකයන් වැනි ප්‍රධාන පුරවැසියන් ද වී සිටිනු දක්නට හැකි බැවිනි.

ඩබ් විජේවන්ත වෙල්ලාල
**(BA, DipEd, MA in Edu.)**
කොළඹ විශ්වවිද්‍යාලය
ලේකම්, අධ්‍යාපන සංවර්ධන සන්ධානය

# සමාජසංවේදී මනුෂ්‍යයන් බිහිකිරීමට අධ්‍යාපන ක්‍රමය වෙනස්විය යුතුය.

වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක පැතිරීම පිළිබඳව තෘප්තිමත් විය හැකි නමුත් එහි ගුණාත්මක වර්ධනය පිළිබඳ තෘප්තිමත් විය නොහැකිය. මන්දයත් සෑම දරුවෙකුම එක සමාන නොවුණත් ඇත්තේ එකම ක්‍රමයකට නිර්මාණය වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයකි. එම අධ්‍යාපන ක්‍රමය මගින් කෙනෙකු දක්ෂයෙකු කරන අතර තවත් කෙනෙකු තමන් අනුවන යැයි සිතන ස්ථානයට ගෙන එයි. තවමත් පාසල තුළින් ළමුන්ව අනාගතයට පුහුණු කරනවා නොව යල් පැනගිය අධ්‍යාපන ක්‍රමයක් ඔස්සේ ඔවුන්ට යටගියාව පුහුණු කරමින් මිලියන ගණන් දරුවන් සිත්පිත් නොමැති රෝබෝට්ටන් බවට පත් කරයි.

මෙම අධ්‍යාපන ක්‍රමය, මිනිසුන්ගේ නිර්මාණශීලීත්වය විනාශ කරමින් බුද්ධිමය වශයෙන් අපචාරයට පත් කිරීම පිළිබඳ වගකිව යුතුය. ලෝකය දැන් දියුණු වී ඇත. ඒ නිසා ලිබරල් ධනවාදී ආර්ථික ක්‍රමයට අවශ්‍ය වන්නේ නිර්මානශීලිව, නව්‍ය ලෙස, ගැඹුරු ලෙස නිදහස්ව සහ එකමුතුව සිතිය හැකි මිනිසුන්ය. නමුත් එක් ගුරුවරයෙකුට එකිනෙකට වෙනස් හැකියාවන්, අවශ්‍යතාවයන් සහ සිහින ඇති ළමයි පිරිසක් ඉදිරියේ සිටගෙන එකම දේ එකම ආකාරයට ඉගැන්වීමට ලැබීම ද ඉතා බිහිසුණු තත්ත්වයකි. මෙය ගුරුවරුන්ගේ වරද නොවුව ද ඔවුන් දරුවන් පුහුණු කරන්නේ විශිෂ්ට ඒ සාමාර්ථයක් සඳහා තරග වැදීමටයි. නමුත් සම්මත විභාග පරීක්ෂණයක ප්‍රශ්න පත්‍රයක නිවැරදි පිළිතුර තේරීම මගින් දරුවෙකුගේ දක්ෂතාවය සහ සාර්ථකත්වය මැනීම ඉතා නොමනා ක්‍රියාවක් බවත් මෙම පරීක්ෂණ තුරන් කර දැමිය යුතු බවත් Frederick j Kelly විසින් පෙන්වා දේ.

පාසලේ විභාග තරණය කිරීමේ අරමුණ නොව සියලුම දරුවන්ගේ ජීවිතයේ නියම අර්ථය ඉදිරියට ගෙන ඒමට හැකිවන පරිදි පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතුය. මෙම අධ්‍යාපන ක්‍රමය තුළින් ලබා දෙන්නේ ශාස්ත්‍රීය දැනුම පමණි. ශාස්ත්‍රීය දැනුම මගින් වැඩ කිරීමට හැකියාවක් නොලැබේ. වැඩකිරීමට ශිල්පීය දැනුම අවශ්‍ය වේ.

"තිබූ තැනක සොර සතුරන් ගත නොහෙනා.
උගත මනා ශිල්පයමයි මතු රැකෙනා"

යනුවෙන් අපේ පැරණි උගතුන් කිවේ අද අපි ලබන ශාස්ත්‍රීය දැනුම පිළිබඳ

> **පාසලේ විභාග තරණය කිරීමේ අරමුණ නොව සියලුම දරුවන්ගේ ජීවිතයේ නියම අර්ථය ඉදිරියට ගෙන ඒමට හැකිවන පරිදි පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතුය.**





නොව ශිල්පීය දැනුම පිළිබඳවයි. ශිල්පීය අධ්‍යාපනය නොදෙන පවතින අධ්‍යාපන ක්‍රමය වසර 13ක් තිස්සේ දරුවන් පාසලක් තුළ ගාල් කර තැබීමෙන් ලබන ආයෝජනය කුමක්ද ?

පවතින පාසල් අධ්‍යාපන ක්‍රමය තුළ ඇති අනික් දුර්වලතාවය වන්නේ දරුවන්ගේ චින්තනය කිසියම් රාමුවකට කොටුකර තැබීමයි. මූලික අධ්‍යාපනය ඉතා වැදගත් වුවද තරගකාරීබව සහ විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතුය. මන්දයත් පාසල් අධ්‍යාපනය නොමැතිව මුළු ලොවම ජයගත් මිනිසුන් ඉතිහාසය තුළ ඕනෑතරම් දක්නට ඇත. ඇල්බට් අයින්ස්ටයින්, ඒබ්‍රම් ලින්කන්, විලියම් ශේක්ෂ්පියර් මේ අතර වේ.

ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීමට යාමේ දී ෆින්ලන්තයේ අධ්‍යාපන ක්‍රමය ආදර්ශයට ගත හැකිය. අධ්‍යාපන ක්‍රමයේ පවතින අපූරු විශේෂතා නිසා ෆින්ලන්තය ලොව සාක්ෂරතාවය අතින් ඉදිරියටම පැමිණි රටකි. තරග විභාගවලින් ඔබ්බට ගිය අධ්‍යාපනයක් සඳහා සිසුන් යොමු කරන ෆින්ලන්තයේ ජාතික මට්ටමෙන් පවත්වන එකම විභාගය වන්නේ උසස්පෙළ සිසුන් සඳහා අවසාන වසරේ පවත්වන විභාගයයි. නවීන තාක්ෂණික විධි යොදාගනිමින් පාසල තුළ අධ්‍යාපනය ක්‍රියාත්මක වන අතර පාසල් මට්ටමින් සංස්කෘතික අංග මෙන්ම ක්‍රීඩාවලට යොමුකරන අතර සෑම වසරකම කෙටි කාලයක් කිසියම් වෘත්තිය පුහුණුවක නියැලීම අනිවාර්ය වේ.

"අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී"

යනුවෙන් කුමාරතුංග මුණිදාසයන් කිවේ ජපානයේ හිරෝෂිමා නාගසාකිවලට පරමාණු බෝම්බ වැටෙන්නට පෙරය. ඒ අනුව රටකට අවශ්‍ය වන්නේ මානව හිතවාදී අධ්‍යාපන ක්‍රමයකි. ලොවට උගත් අමනුෂ්‍යයින් දක්ෂ යක්ෂයින් දායාද කළයුතු නැත.

දෙවන ලෝක යුද්ධ සමයේ හිට්ලර්ගෙන් පලා ආ යුදෙව් ළමයෙකු සිය ගුරුතුමා වෙනුවෙන් තැබූ සටහනක මෙසේ සඳහන් විය.

ආදරණීය ගුරුතුමනි,
මම නාසි කඳවුරකින් මිදී පළා ආවෙක්මි.

බොහෝ මිනිසුන් විසින් නොදුටු,
නොදැකිය යුතු, බොහෝ දෑ මම දුටුවෙමි.
උගත් ඉංජිනේරුවන් විසින් ගෑස් කුටි තනන අයුරු

දක්ෂ වෛද්‍යවරුන් විසින් මිනිසුන්ට විෂ එන්නත් කරන අයුරු
පුහුණුව ලත් හෙදියන් විසින් ළදරුවන් මරා දමන අයුරු
උපාධිදාරීන් විසින් ගැහැණුන් සහ ළමයින් මරා පුළුස්සන අයුරු

මට අධ්‍යාපනය ගැන ඇත්තේ සැකයකි
මගේ ඉල්ලීම, ගුරුවරුන් කියාදිය යුත්තේ සිසුන්ට මානව දයාවෙන් යුතු මිනිසුන් වන අයුරු යන්නයි

ඔබේ උත්සාහය අවසානයේ ලොවට
උගත් අමනුෂ්‍යයන් - දක්ෂ යක්ෂයින්
දායාද කළයුතු නැත.

කියවීම, ලිවිම, ගණිතය, ඉතිහාසය වැදගත් වන්නේ....
ඉන් අපේ අනාගත පරපුර වඩාත් මානව හිතවාදී වීමට
කියාදෙන්නේ නම් පමණි.

**දිනිති අලහප්පෙරුම**

# අධ්‍යාපනය හා සම්බන්ධ වැදගත් දින

## සාක්ෂරතා දිනය

ජාත්‍යන්තර සාක්ෂරතා දිනය යෙදෙනුයේ සෑම වසරකම සැප්තැම්බර් 08 වනදාය. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය මගින් 1965 දී ප්‍රකාශයට පත්කරනු ලැබූ ජාත්‍යන්තර සාක්ෂරතා දිනය ලෝක ප්‍රජාව විසින් මුල්වරට සමරනු ලැබුවේ 1966 වර්ෂයේ දීය. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය අර්ථ දක්වා ඇති පරිදි "කිසියම් භාෂාවකින් දෙනලද පණිවිඩයක් නිවැරදිව කියවීමට හා ලිවීමට ඇති හැකියාව සාක්ෂරතාවයයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කොමිසම විසින් සාක්ෂරතාවය නිර්වචනය කර තිබෙන්නේ "ක්‍රියාශීලි සවන්දීම, පැහැදිලි කථනය, අර්ථාවබෝධය සඳහා කියවීම හා නිවැරදිව ලිවීමට ඇති හැකියාව සාක්ෂරතාවය" ලෙසය.

ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය අනෙක් රටවලට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පවතින අතර එය තුන්වන ලෝකයේ රටකින් බලාපොරොත්තුවන මට්ටමට වඩා වැඩි 92.6% ක සාක්ෂරතා මට්ටමකි. සෑම වරකම සාක්ෂරතා දිනයේදී යුනෙස්කෝ සංවිධානය ලෝක ප්‍රජාවට සිහිගන්වනුයේ ගෝලීය වශයෙන් සියලු ප්‍රජාවගේ සාක්ෂරතාවය ඉහළ දැමීම හා වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳවයි. ඒ අනුව මෙවර (2017) එහි තේමාව වූයේ "Literacy in a Digital world" යන්නයි. ලෝකය අන්තර්ජාල තාක්ෂණය සමග අධිවේගී ලෙස ඉදිරියට යමින් ඇති අතර පාසල් අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරුවරයා, දරුවා. කළු ලෑල්ල සහ හුණුකූර යන සංකල්පයෙන් මුදවා නවීන තාක්ෂණය සමග ඒකාබද්ධ කිරීමට ලෝකයේ රටවල් උත්සාහ කරමින් සිටියි. ඒ අනුව ඩිජිටල් ලෝකයක් කරා පියනගන මාවතේ අධ්‍යාපනය සහ සාක්ෂරතාවය යන්න අත්‍යවශ්‍යය සාධකයක් වී ඇති අතර යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල්වරිය වන අයිරිනා බොකෝවා විසින් ලෝක සාක්ෂරතා දිනය වෙනුවෙන් පණිවිඩයක් නිකුත්කරමින් කියා සිටියේ 2030 වර්ෂයේ තිරසර අධ්‍යාපන අරමුණු ජයගැනීමට නම් ලෝක ප්‍රජාවගේ සාක්ෂරතාවය ඉහළ නැංවිය යුතු අතර සියලු දෙනා අන්තර්ගත වූ අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා තහවුරු කිරීමේ දී ඒ සඳහා පවතින සියලුම බාධක ඉවත් කිරීමට පියවර ගතයුතු බවයි.

ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ඉතා ඉහළ මට්ටමක පැවතුන ද ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව ලංකාවේ අධ්‍යාපනය සඳහා පරිගණක සහ අන්තර්ජාල මාධ්‍යයන් භාවිතය යම්කිසි අවම මට්ටමක පවතින බව දක්නට ලැබේ. සාක්ෂරතාවය අතින් දකුණු ආසියාවේ පළමුතැන සහ ලෝකයේ 12 වන ස්ථානයට පත් වී සිටින ශ්‍රී ලංකාවේ අවුරුදු 25 - 29 ත් අතර වයස් කාණ්ඩයේ පසුවන දරුවන්ගේ පරිගණක සාක්ෂරතාවය 43.1% කී. මෙය අනෙක් රටවලට සාපේක්ෂව ඉතා පහල අගයක් ගන්නා අතර අධ්‍යාපනය ලබන දරුවන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දැනටමත් විවිධ පියවර රැසක් ගෙන ඇත. ඩිජිටල් පන්තිකාමර හඳුන්වා දීම, ඊ- පුස්තකාල ක්‍රමය, උසස් පෙළ හදාරණ සිසුන්ට ටැබ් ලබාදීම වැනි ක්‍රියාමාර්ග හරහා උත්සාහ දරමින් සිටිනුයේ ඩිජිටල් ලෝකයක් සඳහා පියනැගීමේ දී අධ්‍යාපනයේ පවතින බාධාවන් අවම කර ගැනීමයි.

## ජාත්‍යන්තර ගුරු දිනය

ලෝක ගුරු දිනය සමරනු ලබන්නේ ඔක්තෝබර් 5 වනදා වුවද ශ්‍රී ලංකාවේ ගුරු දිනය සමරනු ලබන්නේ ඔක්තෝබර් 6 වන දිනය. එයට හේතුව ගුරුවරුන්ගේ දිගුකාලීන අරගලයක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව සම්මත කරගනු ලැබුවේ 1994 ඔක්තෝබර් 06 වනදා වීමයි. ඒ අනුව ලෝක ගුරු දිනය සැමරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ රටක අනාගතය ගොඩනැගීමේ දී එම රටේ දරුවන් යහපත් පුරවැසියන් කිරීමේ භාරදූර මෙහෙවරක් කරනු ලබන ගුරුභවතුන් ඇගයීම සහ ඔවුන්ගේ පුරෝගාමී මෙහෙවර පිළිබඳ සමාජය දැනුම්වත් කිරීමයි. ඒ අනුව මෙවර ගුරු දිනයේ තේමාව වී ඇත්තේ "ඉගැන්වීමේ නිදහස සහ ගුරුවරුන් සවිබල ගැන්වීම" යන්නයි. ශ්‍රී ලංකාවේ ගුරුදින සැමරුම් වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් ප්‍රකාශ කළේ ගුරුවරුන්ගේ වටිනාකම දිනකට පමණක් සීමා නොකර දිවිය පුරා මතකයේ තබා ගනිමින් ජීවත් වීම සාර්ථකත්වය කරා පුද්ගලයා මෙහෙයවන බවය. පැරණි ඉන්දියානු සාහිත්‍යයේ සඳහන් වන පරිදි දෙවියන් සහ ගුරුවරුන් සිටිනා තැන පළමුව අප වැඳිය යුත්තේ ගුරුවරයාටය. ඒ අනුව ගුරු ජීවිතය උත්තරීතර වන අතර එය තවත් එක් වෘත්තියක් නොව ඉන් ඔබ්බට ගිය තවත් එක් සේවාවක් වන බව පැහැදිලි වේ.

## ලෝක ළමා දිනය

ළමා අයිතීන් සුරැකීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම මුළු මහත් ලෝක ප්‍රජාවගේ යුතුකම ලෙස සළකමින් ලෝක ළමා දිනය ප්‍රථමවරට සමරනු ලැබුවේ 1955 ඔක්තෝබර් මස 01 වනදාය. මෙහි විශේෂත්වය වනුයේ ලෝක ළමා දිනය සැමරීම සඳහා ලෝකයේ රටවල් වර්ෂයේ එක් එක් දින තෝරා ගනු ලැබීමයි. ඒ අනුව රොමේනියාව ලෝක ළමා දිනය සමරනු ලබන්නේ ජුනි මාසයේ පළමුවැනිදාය. එදිනට මෙම රටේ දරුවන්ට නොමිලයේ සත්ව උද්‍යානවලට ඇතුළු වී විනෝදවීමට එරට රජය පහසුකම් සළසා ඇත. ආජන්ටිනාව අගෝස්තු මාසයේ 2 වන දිනත් බ්‍රසීලය ඔක්තෝම්බර් 12 දිනත්, ඉන්දියාව නොවැම්බර් 20 වන දිනත් ලෝක ළමා දිනය සමරනු ලබන අතර ශ්‍රී ලංකාව එය සමරනු ලබන්නේ ඔක්තෝම්බර් පළමු වැනිදාය.

ලෝක ළමා දිනය සැමරීමේ දී ශ්‍රී ලංකාවේ විශේෂත්වය වනුයේ ලෝක ළමා දිනය සහ වැඩිහිටි දිනය එකම දිනකට යෙදී තිබීමයි. මෙවර (2017) එහි තේමා පාඨය වූයේ "මාපිය වැඩිහිටි සෙනෙහස රඳවමු - සොඳුරු ලොවක් වෙත දරුවන් කැඳවමු" යන්නයි. ඒ අනුව ලෝක ළමාදින තේමාව සමස්ත සමාජයටම ඇරයුම් කරනු ලබන්නේ ළමා ලොව සුරක්ෂිත කිරීමේ කාර්යභාරය වෙනුවෙනි. දිවයිනේ සෑම පාසලකම ලෝක ළමාදින සැමරුම් උත්සව පැවැත්වීම ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සිදුවන අතර ශ්‍රී ලංකාවේ ළමාදින පණිවිඩය නිකුත් කරමින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කළේ දරුවන්ට නිසි පෝෂණය, සෞඛ්‍යය පහසුකම්, අධ්‍යාපන අයිතිය මෙන්ම සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා සියලුදෙනා එක්ව කටයුතු කළ යුතු බවයි.

දැයේ දරුවන්ට ලබාදිය හැකි අගනාම සම්පත දැනුම සහ අධ්‍යාපනය වන නිසා දරුවාට පාසල තුළ දැනුම සහ අධ්‍යාපනය ලබාදීමට කටයුතු කිරීම දෙමව්පියන්, ගුරුවරුන් ඇතුළු රටේ සියලු ප්‍රජාවගේ වගකීම වේ. ඒ අනුව පාසල් අධ්‍යාපනය අනිවාර්‍යය කරමින්ද දරුවන්ගේ සෞඛ්‍යය, පෝෂණය සහ මානසික අවශ්‍යතා සැපිරීමට ද ශ්‍රී ලංකා රජය ප්‍රමුඛත්වය දී කටයුතු කරනුයේ එය රටේ අනාගතය සඳහා කරනු ලබන මහගු ආයෝජනය වන නිසාය. ලෝක ළමා දිනය යෙදෙන ඔක්තෝබර් 1 වනදා දින සිට පාසල් සිසුන් හතලිස් පන් ලක්ෂයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ දෙකක "සුරක්ෂා රක්ෂණාවරණය" හඳුන්වා දීම පාසල් දරුවන් වෙනුවෙන් ඉතිහාසය මෙතෙක් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් අතර ප්‍රමුඛතාවය හිමි වේ.

දිනිති අලහප්පෙරුම

# අපේ රටේ අරුම පුදුම ඉස්කෝලයක්

එක්තරා පර්යේෂණ කටයුත්තකට අප කිහිප දෙනෙකු මෙහි සඳහන් කෙරෙන පාසලට ගියේ එක්තරා ඉරිදා දිනෙක හිමිදිරි උදෑසනකය. පෙර දැන්වීමකට අනුව අප එහි යන විට විදුහලුපතිතුමා කාර්යාලයේ රැඳී සිටියේ ය. පෙර දින රාත්‍රියේ පාසලේ රැඳී සිටි බව පෙන්නුම් කෙරෙන පිරිමි ළමුන් කිහිපදෙනෙකු විදුහල්පතිතුමාට වැඳ ආචාරකොට පාසලෙන් පිට වී යන අයුරු අපට දැකගත හැකි විය. ඒ කවුරුන්ද යන්න අපගෙන් කෙනෙකු නැගූ ප්‍රශ්නයකි.

ඒ අපේ පාසලේ මුරකාරයෝ. ඒ වගේම තමාගේ නිවෙස්වලට විදුලි එළිය නැති දුප්පත් ළමයි. පාසලට පැමිණ රාත්‍රී කාලයේ නවාතැන් ගෙන පාසලේ විදුලි එළියෙන් පාඩම් කරන්නට අප අවසර දී තිබෙනවා. තවද එදාමෙදාතුර දරුවන්ගෙන් සිදු වූ කිසියම් විනය විරෝධී ක්‍රියාවක් පිළිබඳ පැමිණිල්ලක් ලැබී නොමැති බව විදුහල්පතිතුමා අප සමග පැවසීය. අපේ රටේ මොනම පාසලකවත් මෙවැනි පුරුද්දක් ගැන අසා නැතිබව අප කණ්ඩායමේ කෙනෙකුගේ පිළිතුර විය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොළ නගරයට නුදුරින් ඇති වේවැල්දෙනිය හන්දියෙන් දකුණුදෙසට කිලෝමීටර් 4ක් පමණ ගියවිට හමුවන ඇත්නාවල රජයේ විදුහලයි ඒ. මෙම පාසලෙහි තිබූ අරුමපුදුම ස්වරූපය විස්තර කිරිම සඳහා ඉතාමත් දීර්ඝ ලිපියක් ලිවිය යුතු බැවින් ඒ සම්බන්ධ අත්‍යවශ්‍යම කරුණු ඉතා සංෂිප්තව දැක්වීම මෙම ලිපියේ අරමුණයි.

ආගිය තොරතුරු කතාබහ කිරීමෙන් සහ කාර්යාලයේ පසෙක සූදානම් කර තිබූ තේ පානයෙන් ද පසු අප පැමිණි කාර්යයට මුල පුරන්නට විමු. විදුහල්පතිතුමාගේ මේසය මත කුඩා ප්ලාස්ටික් බේසමක් විවිධ ප්‍රමාණවල මුදල් කාසිවලින් සහ කොළ කිහිපයකින් පිරී තිබෙනු දක්නට ලැබුණි. ඒ මොනවාද යන්න අප සමග ගිය ජයන්ත කුලරත්න මහතා (ජාතික අධ්‍යාපන ආතනයේ උසස් නිළධාරියෙකු වූ ඒ මහතා දැනට අප අතර නැත) විමසා සිටියේය. ඒ අපේ පාසලේ ළමයි පාසල් භූමියේදී අහුලාගත් මුදල්. එවැනි මුදල් ඔවුන් රැගෙන විත් වහාම මට භාරදෙනවා. අයිතිකරුවන් පැමිණ ඉල්ලුවේ නැතිව ඉතිරි වූ මුදල් තමයි ඔය තියෙන්නේ.

"ඉතින් විදුහල්පතිතුමා ඒ මුදල් මෙවැනි විවෘත භාජනයකට දමා තිබුණාට නැතිවෙන්නේ නැද්ද" ?

"නැහැ... කවදාවත් නහැ".

ඔහුගේ පිළිතුර විය. එම විදුහලේ ගොඩනැගිල්ල දෙස එපිට සිට නරඹන්නෙකුට එය දිස්වන්නේ පාසලක් ලෙස නොව යම් සංචාරක හෝටලයක් වැනි ස්වරූපයකි. එයට හේතු වූයේ ඒවා ඉතා මැතක වර්ණ ගන්වා තිබීමත් ඒවායේ පිහිටීමේ වචිත්‍රවත් ස්වරූපයත් නිසාය.

පාසලේ එක් ගොඩනැගිල්ලක සිට තවත් ගොඩනැගිල්ලකට යන මාවත් සියල්ල සුදු වැලි අතුරා තිබූ අතර දෙපස තීරුව පිපුණු මල් සහිත මල් වැටකින් සීමා විය. තවද එම මගෙහි තැන් තැන්වල මග හරහා එල්ලෙමි තිබූ මල්ගොමු දකින්නට විය. මග දෙපස තිබූ අඹ, රඹුටන්, අලිපේර, වෙරළු වැනි ගස්වල ඉදුණු පළතුරු වලු බර වී මග දෙපස නැමී තිබූ බව කී විට එය අතිශයෝක්තියක යයි කීමට පවා ඉඩකඩ තිබේ.

"ඇයි මේවා ළමයි කඩන්නේ නැද්ද?"

නැහැ හේතුව තමයි ළමයි දන්නවා කවදා හෝ ඒවායේ අස්වනු නෙලූ දාක ඉන් කොටසක් තමාට ලැබෙන බව. එසේත් නැත්නම් ඒවා විකිණුවොත් එම මුදලින් කොටසක් තමාගේ පාස් පොතට වැටෙන බව. මෙසේ කීවේ අප සමග පාසල් වත්තේ ඇවිදීමට ගිය උප විදුහල්පති ජයසිංහ මහතාය. ගොඩනැගිලි තිබූ ප්‍රදේශයට නුදුරින් පෙනෙන්නට තිබුණේ ඒ ඒ නිවාසවලට අයත් කෘෂිකාර්මික බිම් කොටස්ය. ඒ සෑම නිවාසයකටම මල් විලක් තිබුණි. ඕළු නිවාසයට ඕළු විලක්ද, නෙළුම් නිවාසයට නෙළුම් විලක්ද මහනෙල් නිවාසයට මහනෙල් විලක්ද, කුමුදු නිවාසයට කුමුදු විලක්ද වශයෙනි. තව ද ඒ සෑම බිම් කොටසකම බතල, මඤ්ඤොක්කා, බණ්ඩක්කා, වම්බොටු ආදී වගාවන් ඉතාමත් සරුවට වැඩී තිබෙනු දක්නට ලැබුණි. ඒවායේ එලදාවද ළමුන් අතර බෙදාහරින බව කෘෂිකර්ම විෂය ගුරුතුමිය අප සමග පැවසීය.

එවකට පැසලේ තිබූ ගොඩනැගිලි තුනක්ම ගමේ ප්‍රජාවගේ දායකත්වයෙන් සෑදූ ඒවා බව එම ගොඩනැගිලිවල ඇති පුවරුවල ලියා තබා ඇත. එම පුවරුවල ඇති අරුමය නම් එහි සඳහන් නම් ඉදිරියේ ඇත්තේ ඔහු හෝ ඇය දුන් මුදල් ප්‍රමාණය නොව දුන් භාණ්ඩ ප්‍රමාණය හෝ වැය කරන ලද අක්තම් ප්‍රමාණයයි. මෙහි දී විදුහල්පතිතුමා පැවසුවේ යම් කෙනෙක් සවස් වරුවක පැමිණ පැයක් සේවය කළේ නම් එවැනි දින පහක් සේවය කළ පසු ඔහු දිනක අක්තමක් සැපයූ බවට සටහනක් තබන බවයි. එසේ ලබාගත් කෙටි සේවා ක්‍රමය සාර්ථක වූ බවයි.

ගම් වැසියන්ගේ ග්‍රාම සංවර්ධන සමිතිය. සණස සමිතිය, ගොවි සමිතිය, තරුණ ක්‍රීඩා සමිතිය, දහම් පාසල් වැනි ජනතා සමිති සියල්ලක්ම තමාගේ රැස්වීම් පවත්වන්නේ පාසල් ගොඩනැගිලිවල බව විදුහල්පතිතුමා පැවසුවේ ඉතාමත් සතුටිණි.

පාසල විසින් වර්ෂයකට වරක් සිදුකරන "විනීත සතිය" නම් වැඩසටහනක තොරතුරු පාසල් පොත්පත් පරිශීලනය කරද්දී අපට හමු විය. එය ද ඉතාමත් අරුමපුදුමය. වර්ෂයේ එක් සතියක් තුළ දී පාසල් දරුවන්ගේ හා සිය නිවෙස් යහපත් ලෙස සකස් කර ගැනීමට පාසලෙන් කෙරෙන මගපෙන්වීමක් ලෙස මෙය සැළකිය හැකිය. පාසල මගින් සකස්කර දෙන ප්‍රශ්නාවලියකට පිළිතුරු සැපයීම සෑම වැඩිහිටි දරුවෙකු විසින් ම මේ සතිය තුළ සිදුකළ යුතුය. එකී සෑම ප්‍රශ්නයක්ම යොමුවන්නේ දෙමාපියන්ගේ හා නිවෙස් පරිසරය යහපත් කිරීමේ අරමුණ වෙනුවෙනි. මෙම සතිය තුළ දරුවන් සිදුකරන සමීක්ෂණයට සහාය වීමට ගුරුවරුන් ද නම්කර තිබුණි.

පාසල් ලෝග්පොත විමසා බලන විට අප දුටු තවත් වැදගත් කරුණක් මෙහි සඳහන් කළයුතු ය. එනම් ඇත්නාවල සිට ඊට අසල ගමකට වැටී ඇති පටු මාර්ගය තනාදීම පාසල් දරුවන් සහ පාසල් සංවර්ධන සමිතිය විසින් සිදුකරන ලද බවයි. කිලෝමීටරයක් පමණ වන මේ මාර්ගය තැනීමට විශාල මුදලක් හා ශ්‍රමයක් වැය වූ බව එහි සඳහන් විය. ගම මැද දක්නට ලැබුණු පොදු ළිඳ ද පාසලේ දායකත්වයෙන් සෑදූ බව එහි තිබූ නාම පුවරුවේ සඳහන් විය.

පාසලෙන් ගමටත් ගමෙන් පාසලටත් යන සංකල්පය පදනම් කරගෙන මෙම පාසල සංවර්ධනය වූ බව එවකට එහි විදුහල්පතිව සිටි සේනාරත්න මහතා අප සමග පැවසීය.

පාසලේ මෙම සංවර්ධනීය තත්ත්වය උදාකර ගැනීමට ඉහත කී පාසල් ප්‍රජා සම්බන්ධතාවය හේතු වූ අතර එම තත්ත්වය ගොඩනැගීමට එහි විදුහල්පතිතුමාගේ විශිෂ්ට නායකත්වය හේතු වූ බව අප පර්යේෂණ කණ්ඩායමේ නිගමනය විය.


ඩබ් විජේවන්ත වෙල්ලාල
**(BA, DipEd, MA in Edu.)**
කොළඹ විශ්වවිද්‍යාලය
ලේකම්, අධ්‍යාපන සංවර්ධන සන්ධානය





# අධ්‍යාපනය තුළින් සාමකාමී සමාජයක්

## අධ්‍යාපන සංවර්ධන සන්ධානය සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය පිළිබඳව පුහුණු වැඩසටහනක් පවත්වනු ලබයි

තිරසර සංවර්ධන අරමුණු සෑම එකකටම ඒවාට සුවිශේෂී ඉලක්කයන් තිබේ. එසේ නමුත් තිරසර සංවර්ධන සංකල්පයේ දී සාර්ව සංවර්ධනයක් අපේක්ෂා කරන බැවින් මෙම අරමුණු එකිනෙක හුදෙකලාව දිනාගත නොහැකි බවත් ඒවා අතිශයින් ඒකාබද්ධව පවතින බව පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. උදාහරණ වශයෙන් අධ්‍යාපන අරමුණ දිනාගැනීමේ දී ඒ හා ඉතා සමීපව බැඳී පවත්නා දරිද්‍රතාවය අවම කිරීම සහ සෞඛ්‍ය නංවාලීම යන අරමුණු පිළිබඳව අවශ්‍යතාවය සැළකිල්ලට ගත හැකිය. සංවර්ධනයේ සියලු ප්‍රතිලාභයන් නිදහසේ භුක්ති විඳිය හැකිවන්නේ අපගේ සමාජයේ සාමකාමී වාතාවරණයක් පැවතියහොත් පමණි. දීර්ඝකාලීන ගැටුම්කාරී තත්ත්වයනික් අනතුරුව වර්තමානයේ ශ්‍රී ලංකාවට සාමකාමී වාතාවරණයක් උදාවී ඇත. ආර්ථික, සමාජයීය, දේශපාලනික සහ අනන්‍යත්වය යන සාධක මූලික කොටගෙන පැවැති මෙම ගැටුම්කාරී තත්ත්වය සමනය වී ඇති නමුත් දීර්ඝකාලීන සාමයක් උදාකර ගැනීමටත් සංහිඳියාවෙන් යුත් සමාජයක් උදාකර ගැනීමටක් අප වැඩි අවධානයක් යොමුකළ යුතුය. තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමටත් එතුළින් ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය උදාකර ගැනීමටත් හැකිවන්නේ එවැනි වාතාවරණයක් තුළින් පමණි.

මෙවැනි සාමය හා සෞභාග්‍යයෙන් පිරි අනාගතයක් උදාකර ගැනීම සඳහා අප තුළ ඇතිවිය යුතු ආකල්ප වෙනස ඇතිකරගැනීමටත් ඒ සඳහා අප ක්‍රියාත්මක විය යුතු අන්දම පිළිබඳව දැනුම, අවබෝධය හා කුසලතා වර්ධනය කරගැනීම සඳහාත් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ දෙදින නේවාසික පුහුණු වැඩමුලුවක් අගොස්තු මස 12 සහ 13 වැනි දිනයන්හි කොළඹදී පවත්වන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ට හා පාලක මණ්ඩල සාමාජිකයින් මෙම වැඩසටහනට සහභාගී වූ අතර පුහුණුවෙන් අනතුරුව ඔවුන් විසින් පළාත් මට්ටමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ඇත. ද්විතීයික මට්ටමේ මෙම පුහුණු වැඩසටහන් මාලාව නොවැම්බර් මාසයේ දී පැවැත්වීමට අපේක්ෂිතය. කොළඹ 05 හැව්ලොක් පාරේ සාමයික මධ්‍යස්ථානයේ දී පැවැති පුහුණුවට අදාළ ඡායාරූප පහතින් දක්වේ.








# සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් පවත්වයි

දේශපාලනය, රාජ්‍යපාලනය, සංස්කෘතිය සම්බන්ධයෙන් වඩාත් කාර්යක්ෂම අන්දමින් බලපෑම් එල්ල කිරීමේ දී සාම්ප්‍රදායික මාධ්‍ය අභිබවා යාමට සමාජ මාධ්‍යයට හැකි වී තිබේ. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය භාවිතය ප්‍රධාන වශයෙන් උපයෝගී කරගනු ලබන්නේ පෞද්ගලික තොරතුරු තම යහලුවන් අතරේ බෙදාගැනීම සඳහා බව මෑතකදී සිදුකරන ලද අධ්‍යයනයකින් අනාවරණය වී තිබේ. එනමුත් සමාජයට වැඩදායී වෙනස්කම් සිදු කිරීම සඳහා ඵලදායී අන්දමින් සමාජ මාධ්‍ය යොදාගැනීමේ අවකාශයක් පවතී.



සැමට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීමට අවස්ථාව තහවුරු කිරීමෙහිලා සමාජමාධ්‍ය තුළින් සිදුකළ හැකි බලපෑම පිළිබඳව සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමත් බලපෑම් කණ්ඩායමක් වශයෙන් ඔවුන් සවිබල ගැන්මේත් අරමුණු ඇතිව අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සමාජ මාධ්‍ය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් කොළඹ 07 ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ඔක්තෝබර් මස 23 සහ 24 දිනයන්හි දී පවත්වන ලදී

දිස්ත්‍රික්ක 18 ක සාමාජික සංවිධාන නියෝජනය කරමින් තරුණ තරුණියන් 16 දෙනෙක් ඇතුලු පිරිසක් මෙයට සහභාගී වූහ. ෆේස්බුක්, ට්විටර්, ඉන්ස්ට්‍රොග්‍රෑම් වැනි ප්‍රධාන පෙළේ සමාජ මාධ්‍ය මෙවලම් නිවැරදිව ආරක්ෂාකාරීව සහ ඵලදායී අන්දමින් භාවිතා කරන ආකාරය පිළිබඳව න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාගැනීමට මෙම තරුණ තරුණියන්ට මෙහිදී අවස්ථාව උදාවිණි. එසේම ඡායාරූප ගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඡායාරූපයන්හි නිවැරදිභාවය සනාථ කරගැනීම සඳහා භාවිතා කරන තාක්ෂණික මෙවලම් මෙන්ම පණිවිඩ යැවීම සඳහා බහුලව භාවිතා වන ජී මේල් මෘදුකාංගය පිළිබඳවත් හොඳින් අවබෝධ කරගැනීමට ඔවුන්ට හැකිවිණි. සමාජ මාධ්‍ය උපයෝගී කරගනිමින් පණිවිඩ සැකසීමෙ දී අනුගමනය කළයුතු මූලික කරුණු එනම් වඩාත් පැහැදිලි හා ආකර්ශණීය ආකාරයෙන් ඒවා සකස් කිරීම හා අදාළ පුද්ගලයින් වෙත නිවැරදිව ඉලක්ක කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලද අතර අධ්‍යාපනය සම්බන්ධ ඉලක්ක ඇසුරෙන් පණිවිඩ සැකසීමේ ප්‍රායෝගික අභ්‍යාසයකට ද ඔවුන් සහභාගී වූහ

පළමු දින පුහුණුව අවසාන වන විට සමාජමාධ්‍ය හරහා ඔවුන් එකිනෙකා සම්බන්ධව කණ්ඩායම් ගත වී තිබුණු අතර සමාජමාධ්‍ය වෙත පණිඩිඩ නිකුත්කර තිබිණි





අනුරාධපුර දිස්ත්‍රික්කය

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය, සාමාජික සංවිධාන හා එක්ව 2017 ජගත් අධ්‍යාපන සතිය සමරයි

අධ්‍යාපනය සඳහා ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අරමුණින් ප්‍රකාශයට පත්කරන ලද ජගත් අධ්‍යාපන සතිය සෑම වසරකම අප්‍රේල් මාසයේ යෙදෙන අතර මෙවර එහි තේමාව වන්නේ "අධ්‍යාපනය වෙනුවෙන් ක්‍රියාකිරීමට කාලය එළඹ ඇත" යන්නය. 2017 ජගත් අධ්‍යාපන සතියට සමගාමීව අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් දිස්ත්‍රික් 18 ක් තුළ ක්‍රියාත්මක වන එහි සාමාජික සංවිධාන 37 ක සාමාජිකයන් හා එක්ව පාසල් පාදක වැඩසටහන් රැසක් සංවිධානය කරන ලදී.

ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා සියලුදෙනාගේ කැපවීම ලබාගැනීමේ අරමුණ ඇතිව දිවයින පුරා විසිරුණු සාමාජික සංවිධාන විසින් සංවිධානය කරන ලද විවිධ වැඩසටහන් අතර පාසල් සංවර්ධන සමිතිය සමග දැනුම්වත් කිරීමේ වැඩසටහන්, පාසල් ළමුන් අතර කථික සහ විවාද තරග පැවැත්වීම, දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා එළිදැක්වෙන චිත්‍ර තරග සහ ප්‍රදර්ශන, ළමා කඳවුරු පැවැත්වීම සහ අධ්‍යාපනය හා සම්බන්ධ වාර්තා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම වැනි වැඩසටහන් පවත්වන ලදි. ජගත් අධ්‍යාපන සතියට සමගාමීව පවත්වන ලද මේ සියලු වැඩසටහන්වල අවසාන අපේක්ෂාව වුයේ සියලුදෙනාට සමානාත්මතාවයෙන් යුතුව ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් අඛණ්ඩව ජීවිත කාලය පුරා ලබාගැනීම තහවුරු කිරීම යන තිරසර අධ්‍යාපන අරමුණු අංක හතර ජයගැනීම සඳහා ක්‍රියාකිරීමට රජයට බලපෑම් කිරීමයි.

විනිවිද සංවිධානය විසින් පුත්තලම දකුණු කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය සමග එක්ව පුත්/විල්පොත බණ්ඩාරනායක කණිටු විද්‍යාලයේ පැවති චිත්‍ර තරගාවලියේ ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රධානය කිරීමේ උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වෙමින් පුත්තලම දකුණු කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්.පී. නිමල්සිරි මහතා ප්‍රකාශ කළේ තිරසර අධ්‍යාපන අරමුණු ජය ගැනීමට නම් රජය, නිලධාරීන්, ගුරුදෙගුරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම සුභපතන්නන් ද අවබෝධයෙන් යුතුව එක්ව ක්‍රියාකළ යුතු බවයි.

දරුවන්ගේ පෞරුෂය සංවර්ධන සහ අභියෝගවලට මුහුණදීමේ හැකියාව පුළුල් ලෙස වර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව පවත්වන ලද පාසල් ළමුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන හරහා ශ්‍රී ලංකා මානව සංවර්ධන පදනමේ සම්බන්ධතාවය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයින්, විදුහල්පතිතුමිය ඇතුළු ගුරු මණ්ඩලය සමග සම්බන්ධතාවය වැඩිදියුණු කර ගැනීමට උපකාරී වූ බව එහි සභාපති ඇලෙක්සැන්ඩර් පෙරේරා මහතා වැඩිදුර අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.



නුවරඑළිය දිස්ත්‍රික්කය




# අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණය මර්ධනය කිරීමේ ව්‍යාපෘතියක්

අධ්‍යාපන සංවර්ධන සන්ධානය ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහයෝගය මත ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින දූෂණය අවම කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා පත්‍රයක් 2016 අග භාගයේ ඉදිරිපත් කළ අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය 2017 මැයි මාසයේ හිමිවිය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 2017 ජූනි මාසයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන අතරින් දක්ෂකම් හා හැකියාවන් ඇති සම්පත්දායකයින් 25 දෙනෙකු තෝරාගෙන අදාළ විෂය පිළිබඳව ඔවුන් දැනුම්වත් කර, පුහුණුකරුවන් ලෙස පුහුණුකර ඔවුන් මගින් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක තෝරාගත් පාසල් 25ක් ආශ්‍රිතව දෙමව්පියන්, ගුරුවරුන් හා මාධ්‍ය ක්ෂේත්‍රය දැනුම්වත් කිරීම් කර පාසල් ක්ෂේත්‍රයේ පවතින දූෂණය හා වංචාවන් අඩුකිරීමට කටයුතු කිරීමයි.

මෙම කටයුත්ත අධ්‍යාපන සංවර්ධන සන්ධානයට නවමු අත්දැකීමක් විය. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින දූෂණයන් අවම කිරීමේ ව්‍යාපෘතිය ප්‍රධාන අදියර 3ක් යටතේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි.

1. අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන අතරින් ඉහළම සුදුසුකමක් සහිත පුහුණුකරුවන් 25 දෙනෙකු තෝරා අදාළ විෂය සම්බන්ධයෙන් දැනුම ලබාදෙමින් පුහුණු කිරීම

2. එම පුහුණුකරුවන් මාර්ගයෙන් පාසල් 25ක් ආශ්‍රිතව දෙමව්පියන් සහ ගුරුවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

3. දෙමව්පියන්, සම්පත්දායකයින් සමග සැළසුම්ගත උද්දේශන වැඩසටහන් 5ක් ගුවන්විදුලි වැඩසටහන් ලෙස පැවැත්වීම සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණය පිටුදැකීමට කටයුතු කිරීම

ඒ අනුව තෝරාගත් පුහුණුකරුවන්ට අවශ්‍ය දූෂණය පිළිබඳ විෂයබද්ධ සහ ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා දෙදින පුහුණු වැඩමුළුවක් 2017 ජූලි 15 සහ 16 යන දිනවල බත්තරමුල්ල පිහිටි ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම දෙදින පුහුණු වැඩසටහනේ සම්පත් දායකයන් ලෙස කටයුතු කරන ලද්දේ අල්ලස් සහ දූෂණ කොමිසම් සභාවේ හිටපු නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු වූ, නීතිඥ ඒ.කේ. චන්ද්‍රකාන්ත මහතා සහ ජාතික ජලසම්පාදන ජලාපවාහන මණ්ඩලයේ සමාජ විද්‍යාඥ N.I වික්‍රමසිංහ මහතාය.

මේ වනවිට ක්ෂේත්‍ර වැඩසටහන් 20ක් පමණ නිමකර ඇති අතර පාසල් තුළ මෙම මාතෘකාව පිළිබඳ ප්‍රසිද්ධියේ කතා කිරීමට දෙමව්පියන් මැලිබවක් දක්වන බව ක්ෂේත්‍ර වැඩසටහන්වල දී තවදුරටත් පෙනී යයි.









# අධ්‍යාපන සංවර්ධන සන්ධානය තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වයි

පසුගියදා ශ්‍රී ලාංකික පාර්ලිමේතුව විසින් සම්මත කරන ලද 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත කාගේත් කතාබහට ලක් වූ පනතකි. මෙතෙක් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ මූලික අයිතිවාසිකමක්ව නොතිබූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මේ වනවිට ශ්‍රී ලාංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත.






ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2017 සැප්තැම්බර් 17 වන දින කොළඹ සාමයික මධ්‍යස්ථාන පුහුණු ශාලාවේදී පවත්වන ලද අතර මෙහි සම්පත්දයකත්වය ලබාදෙන ලද්දේ ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරන ජගත් ලියනාරච්චි මහතා විසිනි. විශේෂයෙන්ම පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන්නා වූ මහජන හිතකාමී නොවන තීරණ සහ ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රශ්න කිරීමටත් අධ්‍යාපන අයිතීන් දිනාගැනීම තහවුරු කරගැනීම සඳහාත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ දැක්වෙන විධිවිධාන උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව දැනුම්වත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

ඒ අනුව දිවයිනේ දිස්ත්‍රික්ක 17 ක් නියෝජනය කරමින් සිවිල් සංවිධාන සාමාජිකයින් 45 ක් පමණ මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහනට සහභාගී වූ අතර එහිදී තොරතුරු ඉල්ලුම් පත්‍රිකා සම්පූර්ණ කරන්නේ කෙසේද යන්න පිළිබඳව සාමාජික සංවිධාන සාමාජිකයන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලදී.

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
අංක 439/6A සුදර්ශන මාවත, නාවල පාර, රාජගිරිය
Web: cedsrilanka.net
දුරකතනය : 0112887642